සමුපකාර තොග වෙළඳ සංස්ථාව

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන

පටුන

අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක නිලධාරීන්	01-02
සභාපතිතුමාගේ සමාලෝචනය	03
අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව	04-06
වර්ෂය සංක්ෂිප්තයෙන්	07
මූල්‍ය ප්‍රකාශන	08-11
මූල්‍ය ප්‍රකාශන වලට සටහන	12-64
විගණකාධිපතිගේ වාර්තාව	65-79
විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ	80-99

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

2018 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා විධායක නිලධාරීන්

සභාපති	-	මොහොමඩ් රිස්වාන් හමීම් මහතා (2018.11.12 දින දක්වා)
	-	ලක්මාල් රත්නායක මහතා (2018.11.16 දින සිට 2018.12.31 දින දක්වා)
උප සභාපති	-	මොහොමඩ් නසීර් නසීර් මහතා (2018.11.12 දින දක්වා)
	-	ෂහීඩ් කාන් මහතා (2018.11.16 දින සිට 2018.12.31 දින දක්වා)
අධ්‍යක්ෂවරුන්	-	ගීතා සේනාරත්න මිය අධ්‍යක්ෂ (අමාත්‍යාංශ නියෝජිත) අතිරේක ලේකම් (වාණිජ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය. (2018.08.15 දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන ඇත.)
	-	එච්.ජී. සුමනසිංහ මහතා අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත) අධ්‍යක්ෂ ජනරාල්, කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය සහ ජනමාධ්‍ය (2018.01.16 දින සිට)
	-	ඩී. ජීවනාදන් මහතා
	-	එම්.එස්.කේ.කුමාරවර්ධන මහතා
	-	පී.එල්. තිරිමාන්න මහතා
	-	එස්.එෆ්. එම්.රමේෂ් මහතා
වැඩ බලන සාමාන්‍යාධිකාරී	-	විපුල කිත්සිරි සිල්වා මහතා

විගණකවරුන්	-	විගණකාධිපති
බැංකුකරුවන්	-	ලංකා බැංකුව මහජන බැංකුව කොමර්ශල් බැංකුව සම්පත් බැංකුව
ලියාපදිංචි කාර්යාලය	-	නො.27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

සභාපතිතුමාගේ පණිවිඩය.

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂීය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන ද ඇතුළත් වාර්ෂික වාර්තාව සතොස අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ ප්‍රධානතම අරමුණ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය දේශීය වෙළඳපල තුල නිහතාවයක් ඇතිවීම වැලැක්වීම වන අතර, එය රාජ්‍ය මැදිහත් වීම මත සිදුවේ. මෙම පරමාර්ථය ඉටු කිරීමේදී ලාභය මූලික අරමුණ නොව පාරිභෝගික ජනතාවට උපරිම සහනදායී මිලක් ලබාදීම පෙරදැරිව එය සිදුවේ. එසේ කටයුතු කිරීමේදී ගොවි ජනතාවටද සාධාරණය ඉටුවන පරිදි සිදු කිරීමේදී අයතනය මූල්‍ය දුෂ්කරතාවලට පත්වන අතර රාජ්‍ය භාණ්ඩාගාරයේ මැදිහත්වීමෙන් එවැනි තත්වයන් සමනය වේ. පසුගිය දශක කිහිපය තුලම සතොස විසින් එසේ කටයුතු කරමින් ගොවි හා පාරිභෝගික ජනතාවට විශාල මෙහෙවරක් සිදු කර ඇත.

මෙම තත්වයන් තුල ආයතනය සතු ස්ථාවර දේපළ වෙනත් රාජ්‍ය ආයතන හෝ පෞද්ගලික ආයතන වෙත කුලියට දීමෙන් උපයන බදු කුලී ආදායම් සේවක වැටුප් වියදමෙන් 75% ක් පමණ පියවා ගැනීමට වැදගත් දායකත්වයක් ලබා දෙන බැවින් ස්වයං මූල්‍යකරණයට සහනයක් වී ඇත.

2020 මාර්තු මාසයේ සිට මැයි දක්වා දිවයින තුල පැවති Covid – 19 වෛරස වසංගතයේ පළමු අවස්ථාවේදී අභ්‍යන්තර වෙළඳ ආහාර සුරක්ෂිතතාවය හා පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශයේ උපදෙස් මත ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සමඟ එක්ව සතොස ආයතනය විශාල කාර්යභාරයක් ඉටුකරන ලද බව මෙහිදී සඳහන් කරනු කැමැත්තෙමි.

ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ නිර්දේශයන් සහ උපදෙස් මත වී අලෙවි මණ්ඩලය සතු වී තොග සහල් බවට පත් කිරීම සහ එම සහල් ලංකා සතොස අලෙවි ජාලය මඟින් දේශීය වෙළඳපල වෙත සාධාරණ මිලකට ඉදිරිපත් කිරීම තුලින්, සහල් හිඟයක් ඇතිවීම වැලැක්වීමට කටයුතු කිරීමත්, එම කමිටුවේ උපදෙස් මත සහල් මෙ.ටො.110,000 ක් පමණ ආනයනය කර 2017 සහ 2018 වර්ෂයන්හි දේශීය වෙළඳපල තුල සහල් හිඟයක් වලක්වා ගැනීමටත්, මිල ස්ථාවර කර ගැනීමටත්, සතොස ආයතනය කටයුතු කර ඇත.

මෙවැනි වැදගත් ජාතික මෙහෙවර ඉටු කිරීමෙන් සතොස ආයතනය ශ්‍රී ලාංකික පාරිභෝගික ජනතාව වෙනුවෙන් රජය මැදිහත් වීම සිදු කරනු ලබන රජය සතු වැදගත් හස්තයක් බවට පත්වී ඇත.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට, සහ ගරු වෙළඳ අමාත්‍යතුමාට, හා සමස්ථ අමාත්‍ය මණ්ඩලයටත්, ස්තුතිය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ටත්, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ටත් මාගේ ස්තුතිය පළ කර සිටිමි.

තව ද මෙම කාර්යයන් සාර්ථක කර ගැනීමට සහාය දුන් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

තුෂාර දිසානායක
සභාපති.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

අංක 38 දරණ මුදල් පනතේ අංක 14 වගන්ති ප්‍රකාර සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමග ඉදිරිපත් කරනු ඇත.

පොදු කරුණු :

මූලික ක්‍රියාකාරකම්.

1949 අංක 47 දරණ පනතින් ස්ථාපිත කරන ලද සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස නමින් වඩාත් ප්‍රචලිත) සිය ව්‍යාපාරික කටයුතු රජය විසින් ආයෝජනය කළ රු. මිලියනයක මුදලකින් 1950 ජූලි 01 දින සිට ආරම්භ කරනු ලැබ ඇත.

ආරම්භයේදී සතොසෙහි මූලික පරමාර්ථය වනුයේද අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් රාජ්‍ය අංශයේ තොග සහ සිල්ලර වෙළඳ ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලැබීමයි.

එහෙත් වසර 50 කට වඩා වැඩි කාලයක් ශ්‍රී ලාංකික පාරිභෝගික සහ ගොවි ජනතාවගේ සුභසිද්ධිය සඳහා ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී මුහුණ දෙන ලද දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඉදිරිපත් කරන ලද 2004 වර්ෂයේ හා 2006 වර්ෂයේ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයෙන් පසුව ලංකා සතොස ආයතනය වෙත මූලික පහසුකම් සැලසීම පෙරදැරිව කටයුතු කරන අතර. මේ වන විට රජයේ මැදිහත්වීම මත ජීවන වියදම පිළිබඳ අමාත්‍යමණ්ඩල අනුකමිටුව විසින් දෙනු ලබන උපදෙස් මත කටයුතු කරන අතරම ප්‍රවාහන හා ගබඩා පහසුකම් යන සේවාවන් සැපයීම සිදුකරනු ලබයි.

01. <u>ව්‍යාපාරික කටයුතු සමාලෝචනය කිරීම.</u>

අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාවේද කොටසක් වන සභාපතිගේ අදහස් දැක්වීම යටතේ ආයතනය පිළිබඳව වර්තමාන තත්වය සඳහන් කර ඇත.

ඒ අනුව දැනට ප්‍රධානතම ආදායම් මාර්ගය වී තිබෙන ලංකා සතොස ආයතනයට සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනය සතු දේපළ කුලියට දීමෙන් ආදායම් ඉපයීම නව ගිවිසුම් වලට එළඹීමෙන් තවදුරටත් වර්ධනයක කරගෙන ඇත.

02. <u>2018.12.31 දිනට සේවක සංඛ්‍යාවේ විශ්ලේෂණය මෙසේය.</u>

		<u>ස්ථිර</u>	<u>අනියම්</u>	<u>කොන්ත්‍රාත්</u>
1.	විධායක	12	-	03
2.	ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි	36	01	03
3.	වෙනත් සහායක ශ්‍රේණි	281	-	119

03. 2018.12.31 දිනට ආයතනයට එරෙහිව පැවති නඩු

උසාවිය	2017.12.31 දිනට පැවති නඩු	2018 වර්ෂය තුල පවරන ලද නඩු	2018 වර්ෂය තුල සම්පූර්ණ නඩු	2018 වර්ෂයේ අවසන් නඩු	තවදුරටත් විභාග වන නඩු
ඉහල උසාවිය	04	01	05	01	04
දිස්ත්‍රික් උසාවිය	06	-	06	-	06
මහේස්ත්‍රාත් උසාවිය	04	02	06	-	06
කම්කරු විනිශ්චය සභාව	04	01	05	01	04
කම්කරු පරීක්ෂණ	08	-	08	-	08
බේරුම්කරණ නඩු	01	-	01	-	01
බහා තැබූ නඩු	03	-	03	-	03
අභියාචනා නඩු	02	01	03	-	03

04. අඛණ්ඩ පැවැත්මේ සංකල්පය

සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරීත්වය විසින් තක්සේරු කරනු ලබන අතර. අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා අවශ්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සැහීමකට පත්වීමට හැකි බව ප්‍රකාශ කර සිටිමි.

2017/2018 වර්ෂ වල රජයේ අවශ්‍යතාව සඳහා පිරිවැයට වඩා අඩු මුදලකට සහල් ආනයනය කර ඇති අලෙවි කිරීමට සංස්ථාවට සිදු වූ අතර. ඒ වෙනුවෙන් මහජන බැංකුව වෙත ගෙවිය යුතු ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් 2021 ජූලි මස සිට වාරික 60 කින් ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. සංස්ථාවට අයවිය යුතු ඉතිරි මුදල් සම්බන්ධව අදාල පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගෙන තිබේ. ලංකා සතොස ආයතනය විසින් ද ඉහත ව්‍යාපෘතිය යටතේ සංස්ථාවෙන් මිළට ගත් සහල් වෙනුවෙන් මුදල් ගෙවීම 2021.11.15 දින සිට ආරම්භ කර ඇත.

කළමනාකාරීත්වය විසින් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව නිරන්තර අවධානය යොමු කරන අතර. පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට මහා භාණ්ඩාගාරය සහ වෙළඳ අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය උපදෙස් ලබා ගනිමින් අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගනු ලබන බවද සඳහන් කරමි.

05. විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ. 154(1) වගන්තිය සමග කියවියයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (01) ප්‍රකාරව ආයතනයේ විගණක විය යුත්තේ රජයේ විගණකාධිපතිය.

06. සතොස ආයතනයට අගනා මග පෙන්වීම සහ සහාය ලබාදීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට, ගරු වෙළඳ අමාත්‍යතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමාට සහ අමාත්‍යාංශයේ සියළුම නිලධාරී මහතුන්ට ස්තුති වන අතර, වර්ෂය තුල අපට සහයෝගය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ, භාණ්ඩාගාරයේ සහ අනෙකුත් අමාත්‍යාංශ වල සියළු කාර්යමණ්ඩලිකයන්ටද අපි ස්තුතිවන්ත වෙමු.

අපගේ වඩාත්ම වැදගත් සම්පත අපගේ කාර්ය මණ්ඩලයයි. ගතවූ වසර තුල ඉටුකළ සේවාව සහ දැක්වූ සහයෝගය පිළිබඳව සියළු කාර්ය මණ්ඩලිකයන්ට අපි ස්තුතිවන්ත වෙමු.

අප වෙත අඛණ්ඩ අනුග්‍රහයක් දැක්වූ අගනා පාරිභෝගික ජනතාවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්තුතිය පුද කර සිටී. තවද, විවිධ ව්‍යවස්ථාපිත ආයතන පුද්ගලික අංශයේ ආයතනයන්ටද අපගේ බැංකුකරුවන් වෙතද අපි ස්තුතිය පුද කර සිටිමු.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව (සකොස)
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(ලංකා රුපියල් වලින් දක්වා ඇත).

දෙසැම්බර් 31 ත් අවසන් වන වර්ෂය සඳහා		සමූහය		සකොස	
		2018	2017	2018	2017
	සටහන		අය සටහන		
ආදායම	3	1,156,356,349	2,854,384,271	915,286,497	2,644,505,918
විකුණුම් පිරිවැය	4	(861,206,800)	(2,825,517,997)	(647,359,927)	(2,651,287,822)
දළ ලාභය		**295,149,549**	**28,866,273**	**267,926,570**	**(6,781,905)**
වෙනත් මෙහෙයුම් ආදායම්	5	(2,163,818,182)	488,139,596	(2,160,244,227)	489,707,718
පරිපාලන වියදම්	6	(369,256,211)	(396,109,122)	(342,156,038)	(359,965,298)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්		(675,193)	(343,242)	-	-
හානිකරණ සඳහා ප්‍රතිපාදන ප්‍රතිවර්තනය	33	154,800	(2,852,000)	154,800	(2,852,000)
මෙහෙයුම් වලින් ලද ලාභය/ (අලාභය)		**(2,238,445,237)**	**117,701,506**	**(2,234,318,895)**	**120,108,516**
මූල්‍ය ආදායම්	7	4,155,785	6,513,088	748,663	2,237,692
මූල්‍ය පිරිවැය	7	(2,874,785)	(11,254,738)	(2,874,785)	(11,254,738)
බදුකරණයට පෙර ලාභය/ (අලාභය)		**(2,237,164,237)**	**112,959,857**	**(2,236,445,017)**	**111,091,470**
ආදායම් බදු වියදම්	8	(963,154)	(6,122,269)	-	(5,000,000)
වර්ෂය සඳහා ලාභය/ (අලාභය)		**(2,238,127,390)**	**106,837,587**	**(2,236,445,017)**	**106,091,470**
වෙනත් විසතීර්ණ ආදායම්		-	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් / (වියදම්)		**(2,238,127,390)**	**106,837,587**	**(2,236,445,017)**	**106,091,470**
ආරෝපණය කරනු ලබන්නේ					
-මව් සමාගමෙහි ස්කන්ධ දැරීම්		(2,238,127,390)	106,837,587	(2,236,445,017)	106,091,470
පාලනය නොවන බැඳියාව		-	-	-	-

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් ඇක්වේ.

පිටු අංක 6 සිට 44 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යකලන කොටසක් වේ.

සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස)
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ)

දෙසැම්බර් මස 31 වන දිනට	සටහන	සමූහය 2018	සමූහය 2017 (නැවත සඳහන් කළ)	සතොස 2018	සතොස 2017
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත සහ උපකරණ	9	1,165,784,430	1,220,897,613	1,163,127,527	1,218,566,551
ආයෝජන ප්‍රතිපත්ති	10	5,267,725,504	5,308,580,047	5,267,725,504	5,308,580,047
කල්බදු ඉඩම්	11	1,448,663	773,704	1,448,663	773,704
අස්පෘශ්‍ය වත්කම්	12	2,303,245	2,773,636	2,303,245	2,773,636
පරිපාලිත සමාගම්වල අයෝජනයකිරීම්	13	-	-	20	20
වෙනත් ආයෝජන	14	77,115,587	73,004,390	32,722,560	32,722,560
ආයෝජන සඳහා අත්තිකාරම්	15	98,909,871	98,909,871	98,909,871	98,909,871
මුළු ජංගම නොවන වත්කම්		**6,613,287,300**	**6,704,939,261**	**6,566,237,390**	**6,662,326,389**
ජංගම වත්කම්					
භාණ්ඩ තොග	16	153,520,484	5,111,039,251	153,520,484	5,111,039,251
වෙළඳ සහ වෙනත් ලැබීම්	17	721,525,003	1,730,979,355	448,260,842	1,388,953,638
විශේෂ ව්‍යාපෘති/ සේවා මගින් ලැබීම්	18.1	3,715,578,387	1,298,388,617	3,715,578,387	1,298,388,617
භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු	19	297,544,962	153,038,180	297,544,962	153,038,180
වෙනත් මූල්‍ය නොවන වත්කම්	20	2,751,295	7,083,237	2,751,295	7,083,238
මුදල් හා මුදල් සමාන දෑ	21	322,606,351	421,361,312	252,227,453	349,195,526
මුළු ජංගම වත්කම්		**5,213,526,482**	**8,721,889,953**	**4,869,883,423**	**8,307,698,450**
මුළු වත්කම්		**11,826,813,782**	**15,426,829,214**	**11,436,120,813**	**14,970,024,839**
හිමිකම් සහ වගකීම්					
හිමිකම්					
දායක ප්‍රාග්ධනය	22	4,398,056,590	4,398,056,590	4,398,056,590	4,398,056,590
සංචිත	23	8,747,626,148	8,747,626,148	8,747,626,148	8,747,626,148
රඳවාගත් ඉපයීම් (ණය)		(14,404,021,440)	(12,161,588,393)	(14,462,022,678)	(12,220,333,960)
මව සමාගමේ ස්කන්ධ හිමිකරුවන් වෙත ආරෝපණය කරනු ලබන ස්කන්ධ		**(1,258,338,703)**	**984,094,345**	**(1,316,339,940)**	**925,348,778**
පාලනය නොවන බැඳියාව		-	-	-	-
මුළු හිමිකම්		**(1,258,338,703)**	**984,094,345**	**(1,316,339,940)**	**925,348,778**
ජංගම නොවන වගකීම්					
භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	24	4,929,286,565	4,929,286,565	4,929,286,565	4,929,286,565
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	25	45,830,608	44,053,023	38,780,130	41,425,477
මූල්‍ය කල්බදු බැඳීම් - ජංගම නොවන නොටස	27	48,125,291	8,035,318	48,125,291	8,035,318
මුළු ජංගම නොවන වගකීම්		**5,023,242,464**	**4,981,374,906**	**5,016,191,986**	**4,978,747,360**
ජංගම වගකීම්					
වෙළඳ සහ වෙනත් ගෙවීම්	28	591,120,258	1,013,640,678	336,839,499	684,371,254
විශේෂ ව්‍යාපෘති/ සේවා සඳහා ගෙවිය යුතු දෑ	18.2	1,359,698,461	3,589,243,208	1,359,698,461	3,589,243,208
බැංකු ණය - ජංගම කොටස	26	5,648,183,221	4,316,790,649	5,648,183,221	4,316,790,649
මූල්‍ය කල්බදු බැඳීම් - (ජංගම කොටස)	27	4,886,963	73,968,930	4,886,963	73,968,930
වෙනත් මූල්‍ය නොවන වගකීම්	29	452,954,698	458,155,186	381,594,203	392,997,955
බැංකු අයිරා	21	5,066,420	9,561,312	5,066,420	8,556,706
මුළු ජංගම වගකීම්		**8,061,910,021**	**9,461,359,963**	**7,736,268,767**	**9,065,928,702**
මුළු හිමිකම් සහ වගකීම්		**11,826,813,782**	**15,426,829,214**	**11,436,120,813**	**14,970,024,840**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කර තිබේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් ඇත්වේ.
පිටු අංක 6 සිට 44 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් වේ.

2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

සමූහය		දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	පොදු සංචිත	ණය රැඳවුම් සංචිත	වාහන ප්‍රතිස්ථාපන සංචිත	ප්‍රකෘතාගණන සංචිත	ප්‍රතිවසුහගත කිරීමේ සංචිත	රඳවාගත් ඉපැයුම් (අය)	මුළු මුදල (නැවත සඳහන් කළ)
2017 ජනවාරි මස 01 වන දිනට ශේෂය		**4,398,056,590**	**32,444,879**	**94,477,411**	**300,289,603**	**72,218,000**	**6,741,632,672**	**1,506,563,583**	**(11,970,342,803)**	**1,175,339,935**
පූර්ව වර්ෂයේ ගැලපීම්		-	-	-	-	-	-	-	(26,194)	(26,194)
2017 ජනවාරි 01 දිනට ශේෂය *(නැවත සඳහන් කළ)*		**4,398,056,590**	**32,444,879**	**94,477,411**	**300,289,603**	**72,218,000**	**6,741,632,672**	**1,506,563,583**	**(11,970,368,997)**	**1,175,313,741**
පූර්ව වර්ෂයේ ගැළපුම්	සටහන I	-	-	-	-	-	-	-	(298,384,477)	(298,384,477)
සටහන් නොවූ බැංකු ශේෂ හඳුනාගැනීම්	සටහන II	-	-	-	-	-	-	-	327,494	327,494
වර්ෂය සඳහා විස්තිර්ණ වියදම්		-	-	-	-	-	-	-	106,837,587	106,837,587
		4,398,056,590	**32,444,879**	**94,477,411**	**300,289,603**	**72,218,000**	**6,741,632,672**	**1,506,563,583**	**(12,161,588,393)**	**984,094,345**
පූර්ව වර්ෂයේ ගැළපුම්	සටහන I	-	-	-	-	-	-	-	(4,305,657)	(4,305,657)
වර්ෂය සඳහා විස්තිර්ණ වියදම්		-	-	-	-	-	-	-	(2,238,127,390)	(2,238,127,390)
2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය		**4,398,056,590**	**32,444,879**	**94,477,411**	**300,289,603**	**72,218,000**	**6,741,632,672**	**1,506,563,583**	**(14,404,021,440)**	**(1,258,338,703)**

සටහන I:
පූර්ව වර්ෂයේ ගැළපුම් පූර්ව වර්ෂයට අදාළ වෙනත් හඳුනානොගත් මෙහෙයුම් වියදම් වල ධාරණ අගය නිවැරදි කිරීම් වේ.

සටහන II
පූර්ව වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශනයන්හිගත් අත්හැරුණු ඇතැම් බැංකු ශේෂයන්,පංගම් ගිණුම් සහ කැන්පතු මුදල් සහ මුදල් සමාන දෑ යටතේ හඳුනාගෙන අදාල වර්ෂය තුලදී වර්තා කරන ලදී

ප්‍රවර්තන වර්ෂය තුළ දී එබඳු ශේෂයන් හඳුනාගත නොහැකි විය.

වර්ෂාන් තුළ ඇති සංඛ්‍යා මෙතින් අඩුකිරීම් ඇත්වේ.
පිටු අංක 6 සිට 44 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

සකොස		දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	පොදු සංචිත	ණය රැඳවුම් සංචිත	වාහන ප්‍රතිස්ථාපන සංචිත	ප්‍රකෘතිගණන සංචිත	ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිත	රඳවාගත් ඉපැයුම් (අය)	මුළු මුදල
2017 ජනවාරි මස 01 වන දිනට ශේෂය		**4,398,056,590**	**32,444,879**	**94,477,411**	**300,289,603**	**72,218,000**	**6,741,632,672**	**1,506,563,583**	**(12,032,034,219)**	**1,113,648,519**
පූර්ව වර්ෂයේ ගැළපුම්	සටහන I	-	-	-	-	-	-	-	(294,718,705)	(294,718,705)
සටහන් නොවූ බැංකු ශේෂ හඳුනාගැනීම්	සටහන II	-	-	-	-	-	-	-	327,494	327,494
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ වියදම්		-	-	-	-	-	-	-	106,091,470	106,091,470
2018 දෙසැම්බර් මස 31 වන දිනට ශේෂය		**4,398,056,590**	**32,444,879**	**94,477,411**	**300,289,603**	**72,218,000**	**6,741,632,672**	**1,506,563,583**	**(14,462,022,678)**	**(1,316,339,940)**
පූර්ව වර්ෂයේ ගැළපුම්	සටහන I								(5,243,701)	(5,243,701)
වර්ෂය සඳහා විස්තීර්ණ වියදම									(2,236,445,017)	(2,236,445,017)
2018 දෙසැම්බර් මස 31 වන දිනට ශේෂය		**4,398,056,590**	**32,444,879**	**94,477,411**	**300,289,603**	**72,218,000**	**6,741,632,672**	**1,506,563,583**	**(14,462,022,678)**	**(1,316,339,940)**

සටහන I:
පූර්ව වර්ෂයේ ගැළපුම් පූර්ව වර්ෂයට අදාළ වෙනත් හඳුනානොගත් මෙහෙයුම් වියදම් වල ධාරණ අගය නිවැරදි කිරීම් වේ.

සටහන II
පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් ඉවත් කරන ලද ඇතැම් බැංකු ශේෂයන්, ස්ථාවර තැන්පත් අදාල වර්ෂය තුලදී මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් හඳුනාගෙන වාර්තා කරන ලදී

ප්‍රවර්තන වර්ෂය තුළ දී එබඳු ශේෂයන් හඳුනාගත නොහැකි විය.

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් ඇත්තේ.
පිටු අංක 6 සිට 44 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් වේ.

(ලංකා රුපියල් වලින් දක්වා ඇති)

දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	සමූහය 2018	සමූහය 2017 (නැවත සඳහන් කළ)	සතොස 2018	සතොස 2017
මෙහෙයුම් ක්‍රියාවලින් ලද මුදල් ප්‍රවාහය					
බදුකරණයට පෙර ලාභය / (අලාභය)		(2,237,164,237)	112,959,857	(2,236,445,017)	111,091,470
ගැළපුම්					
ක්ෂයකිරීම්		113,548,231	135,673,286	112,701,194	135,135,639
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂයවීම		470,391	421,906	470,391	421,906
කුලී ඉඩම් ක්‍රමක්ෂය වීම		(674,959)	755,811	(674,959)	755,811
දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් ලද ශුද්ධ ලාභය		(2,733,000)	(8,263,477)	(2,733,000)	(8,263,477)
වර්ෂය සඳහා පාරිතෝෂික ගෙවීම්		7,301,023	12,448,082	537,402	10,760,582
හානිකරණය සඳහා වෙන්කිරීම්		(154,800)	2,852,000	(154,800)	2,852,000
පූර්ව වර්ෂයේ ගැළපුම්		(4,305,657)	(298,056,983)	(5,243,701)	(294,391,211)
පොළී වියදම්		2,874,785	24,627,729	2,874,785	24,627,729
පොළී ආදායම්		(4,155,785)	(6,513,088)	(748,663)	(2,237,692)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)		**(2,124,994,007)**	**(23,094,878)**	**(2,129,416,368)**	**(19,247,244)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්					
භාණ්ඩ තොග		4,957,518,767	(5,080,877,937)	4,957,518,767	(5,080,877,937)
වෙළඳ සහ වෙනත් ලැබීම්		1,009,609,152	(1,310,418,495)	940,847,596	(1,040,828,285)
විශේෂ ව්‍යාපෘති/ සේවා මඟින් ලැබිය යුතු/ ගෙවිය යුතු මුදල්		(4,646,734,517)	2,104,377,687	(4,646,734,517)	2,104,377,688
භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු		(144,506,782)	-	(144,506,782)	-
වෙනත් මූල්‍ය නොවන වත්කම්		4,331,943	(5,022,774)	4,331,941	(5,022,774)
වෙළඳ සහ වෙනත් ගෙවීම්		(422,520,421)	336,728,796	(347,531,756)	104,136,594
වෙනත් මූල්‍ය නොවන වගකීම්		33,487,480	75,313,515	23,246,831	42,831,878
මෙහෙයුම් (භාවිත කරන ලද) ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල්		**(1,333,808,385)**	**(3,902,994,087)**	**(1,342,244,287)**	**(3,894,630,081)**
ගෙවන ලද බදු		(39,651,122)	189,482,816	(34,650,583)	190,666,782
ගෙවන ලද පාරිතෝෂික		(5,523,439)	(2,583,642)	(3,182,750)	(2,555,342)
ගෙවන ලද පොළිය		(574,922)	(9,160,454)	(574,922)	(9,160,454)
මෙහෙයුම් (භාවිත කරන ලද) ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**(1,379,557,867)**	**(3,725,255,367)**	**(1,380,652,542)**	**(3,715,679,095)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්					
දේපළ, පිරියත හා උපකරණ අත්කරගැනීම්		(17,580,505)	(6,714,413)	(16,407,627)	(4,792,909)
අස්පෘශ්‍ය වත්කම් අත්කරගැනීම්		-	(605,860)	-	(605,860)
දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් ලද ලාභය		2,733,000	69,622,852	2,733,000	69,622,852
ස්ථිර කැන්පතු/ ලද පොළී මඟින් ලබාගත් ශුද්ධ ආයෝජන		44,588	90,316,715	748,663	2,237,692
මෙහෙයුම් (භාවිත කරන ලද) ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**(14,802,917)**	**152,619,294**	**(12,925,964)**	**66,461,774**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය					
ණය මඟින් ලද ශුද්ධ ලාභය		1,331,392,572	4,109,030,159	1,331,392,572	4,109,030,159
මූල්‍ය බදු ශුද්ධ පියවීම්		(31,291,856)	(141,007,839)	(31,291,856)	(141,007,839)
මෙහෙයුම් (භාවිත කරන ලද) ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල්		**1,300,100,715**	**3,968,022,321**	**1,300,100,717**	**3,968,022,320**
වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වෙනස්වීම්		**(94,260,069)**	**395,386,249**	**(93,477,790)**	**318,804,999**
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		411,800,000	16,413,751	340,638,820	21,833,821
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	21	**317,539,931**	**411,800,000**	**247,161,030**	**340,638,820**
			141,659,274	247,161,033	84,796,096

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් ඇක්වේ.

පිටු අංක 6 සිට 44 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් වේ.

1. ආයතනික තොරතුරු

1.1 වාර්තාකරණඅස්තිත්වය

සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස), 1949 අංක 47 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ආයතනයකි. සතොසෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක 27 දරන ස්ථානයේ පිහිටා ඇත.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සතොසෙහි හා එහි පරිපාලිත සමාගම්හි (සතොස හා එහි පරිපාලිත සමාගම් සියල්ල "සමූහය" ලෙස හැඳින්වෙන) මූල්‍ය තොරතුරුවලින් සමන්විත වේ.

වාර්තාකරණ මූල්‍ය වර්ෂය අවසානය වන විට සතොසෙහි ස්ථිර පදනම මත සේවකයින් 436 ක්, එක් අනියම් සේවකයෙක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 108 ක්ද සිටී.

පෙර මූල්‍ය වර්ෂය අවසානය වන විට සතොසෙහි ස්ථිර පදනම මත සේවකයින් 353 ක්, එක් අනියම් සේවකයෙක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 175ක් වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

1.2.1 මව් සමාගම

ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් වෙත අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග සහ සිල්ලර වශයෙන් ලබාගැනීම සඳහා පහසුකම් සම්පාදනය කිරීම, ලංකා සතොස ලිමිටඩ් ආයතනය වෙත ධාන්‍ය ඇඹරුම් පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් සැපයීම සතොසෙහි ප්‍රධානතම කාර්යය වේ.

1.2.2 පරිපාලිත සමාගම්

සිඩබ්ර් ඉකොනොමික් සෙන්ටර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ ආරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයීම යි.

සිඩබ්ර් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉන්ජිනියරින්ග් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ ශ්‍රී ලංකා රජය වීසින් පිරිනමන ඉදිකිරීමේ ව්‍යාපෘති භාර ගැනීම හා උප කොන්ත්‍රාක්කරුවන් හරහා එවැනි ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම යි. මීට අමතරව, දිවයින පුරා පිහිටි ලංකා සතොස වෙළඳසැල් සඳහා ස්ථාවර වත්කම් (ජෙනරේටර්ස්, කූලර්ස්, රාක්ක, කිරුම් උපකරණ, නාම පුවරු යනාදිය) සැපයීමේ කටයුතුවලද මෙම සමාගම නිරතවී සිටියි.

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ දී සතොසෙහි සහ එහි සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවී නැත.

1.3. වාර්තාකරණ දිනය

සතොසෙහි මූල්‍ය වාර්තාකරණ කාලය දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන අතර, එහි පරිපාලිත සමාගම්හි මූල්‍ය වාර්තාකරණ කාලය මාර්තු 31 වන දිනෙන් අවසන් වේ. කෙසේනමුත් පරිපාලිත සමාගම් ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේ.

1.4 නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලය වීසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2021.03.31 දින නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ඒකාබද්ධ සහ තනි මූල්‍ය ප්‍රකාශ 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, වීස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ඒකාබද්ධ ප්‍රකාශය සහ සටහන් සහිත මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ ("මූල්‍ය ප්‍රකාශ"). මෙම ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වීසින් දක්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKASs) මෙන් ම 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.2 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ වගකීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව සමූහයෙහි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරනු ලැබේ.

2.3 විදේශීය මුදල්පරිවර්තනය කිරීම

2.3.1 ව්‍යවහාරික සහ ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත වන ගනුදෙනු හා ශේෂ මනිනු ලබන්නේ ව්‍යාපාරික අස්තිත්වය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ මුදල් ඒකකයෙනි. සමූහයේ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

2.3.2 මුදල් ගනුදෙනු සහ ශේෂයන්

විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුකරන ගනුදෙනු අදාළ ගනුදෙනුව සිදුකරන දිනයේ පවතින විනිමය අනුපාතිකයට අනුව ව්‍යවහාරික මුදල් ඒකකයට පරිවර්තනය කෙරේ. මෙවැනි ගනුදෙනු පියවීමේ දී සහ විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් ඇති මූල්‍යමය වත්කම් හා වගකීම් වර්ෂ අවසානයේ පවතින විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කිරීමේදී පැන නඟින විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් වේ.

ක්‍රමක්ෂය කළ පිරිවැයේ සිදුවන වෙනස්කම් ආශ්‍රිත පරිවර්තන වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් වේ.

2.4. ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සමාන අයිතමවලින් සමන්විත සෑම ද්‍රව්‍ය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන් වශයෙන් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 1 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' සහ එහි සංශෝධන මඟින් අවශ්‍යතාව සලසා දී ඇති පරිදි අප්‍රමාණවත් වන්නේ නම් මිස අසමාන ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් යුතු අයිතම වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශවල අවබෝධය සහ සංසන්දනාත්මක බව තහවුරු කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ක්‍රමානුකූලව ඉදිරිපත් කෙරේ. ප්‍රමාණාත්මක නොවන තොරතුරු මඟින් ප්‍රමාණාත්මක තොරතුරුවල පැහැදිලිභාවය අඩුකිරීමෙන් හෝ විවිධ ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් යුතු ද්‍රව්‍යමය අයිතම සමාහරණය මඟින් මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණෙනු නොලැබේ.

2.5. හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ මුදල හිලව් කරනු ලබන්නේ හදුනාගත් මුදලක් පියවීමට නීත්‍යානුකූලව බලය උපයෝගී කළහැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වගකීම් පියවීමට අදහසක් පවතින විට පමණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKASs) ප්‍රකාරව අවශ්‍ය හෝ අවසර ලබා දී ඇත්නම් මිස සහ සැලකිය යුතු අන්දමෙන් විශේෂයෙන් අනාවරණය කර ඇත්නම් මිස ආදායම් ප්‍රකාශයේ ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

2.6. ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් කර ඇති අතර එමඟින් ආයතනයේ අපේක්ෂිත අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් පවතින බවට සෑහීමට පත්ව තිබේ. එමෙන් ම අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන අඛණ්ඩව සූදානම්ව සිටීමට සමූහයට/සමාගමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිද්ධි හෝ තත්වයන්ට අදාළ කිසිදු සැලකිය යුතු අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත්ව නොමැත.

2.7. මිණුම්කරණයේ පදනම

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඇතුළත් පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතම හැර ඓතිහාසික පිරිවැය පදනම මත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේ.

- දේපල,පිරියත සහ උපකරණ සහ ආයෝජන දේපල සාධාරණ වටිනාකමකින් මනිනු ලැබීම.
- මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් සාධාරණ වටිනාකමකින් මනිනු ලැබීම.
- ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය මත පදනම්ව එහි වර්තමාන අගයන්ට අනුව නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මනිනු ලැබීම.

2.8. ඒකාබද්ධකරණ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් සමූහයේ සහ එහි පරිපාලිත සමාගම්හි මූල්‍ය ප්‍රකාශවලින් සමන්විත වේ. ආයෝජිතයා සමඟ සමූහය විසින් විසින් පවත්වාගෙන යනු ලබන කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ප්‍රතිලාභ සඳහා සමූහය නිරාවරණය වීම හෝ ඒ සඳහා සතු හිමිකමක් මත පාලනය අත්පත් කරගත හැකි අතර ආයෝජිතයා මත පවත්නා බලය ඔස්සේ එකී ප්‍රතිලාභ කෙරේ බලපෑමක් ඇති කිරීමේ හැකියාව සතු වේ. විශේෂයෙන්ම සමූහය සතුව පහත සඳහන් දෑ ඇත්නම්, සහ ඇත්නම් පමණක් සමූහය විසින් ආයෝජනලාභියා පාලනය කරනු ලැබේ:

- ආයෝජිතයා කෙරෙහි වූ බලය (එනම් ආයෝජිතයාගේ අදාළ කටයුතු මෙහෙයැවීම සඳහා ප්‍රවර්තන හැකියාව ලබාදෙන දැනට පවතින හිමිකම්),
- ආයෝජිතයා සමඟ සමූහය විසින් පවත්වාගෙන යනු ලබන කටයුතු හේතුවෙන් විචල්‍ය ප්‍රතිලාභවලට නිරාවරණය වීම හෝ හිමිකම,
- එකී ප්‍රතිලාභ කෙරෙහි බලපෑම සඳහා ආයෝජිතයා මත පවත්නා බලය භාවිත කිරීමේ හැකියාව.

සාමාන්‍යයෙන්, බහුතර ඡන්ද හිමිකම මඟින් පාලනය ප්‍රතිඵල වනාබවට අනුමතියක් පවතී. මෙම අනුමතියට පක්ෂව සහ ආයෝජිතයෙකුගේ ඡන්ද හිමිකම හෝ එවැනි සමාන හිමිකම්වලින් බහුතරයකට අඩු සංඛ්‍යාවක් සමූහය සතු විට, සමූහයට ආයෝජිතයා කෙරෙහි පාලනයක් තිබෙදැයි තක්සේරු කිරීම සඳහා සමූහය විසින් පහත කරුණු ද ඇතුළුව සියලු අදාළ කරුණු හා තත්ත්වයන් සැලකිල්ලට ගනු ලැබේ:

- ආයෝජිතයාගේ අනෙකුත් ඡන්ද හිමියන් සමඟ පවතින ගිවිසුම්ගත එකඟවීම්
- අනෙකුත් ගිවිසුම්ගත එකඟවීම්වලින් පැන නඟින හිමිකම්.
- සමූහයේ ඡන්ද හිමිකම් හා ඉවය ඡන්ද හිමිකම්.

පාලනයේ මූලික අංග තුනෙන් එකකට හෝ වැඩිගණනකට වෙනස්කම් සිදුව ඇති බවට අදාළකරුණු හා තත්ත්වයන් ආශ්‍රයෙන් පෙන්නුම් කෙරේ නම්, සමූහය විසින් ආයෝජිතයෙකු පාලනය කරන්නේ ද නොකරන්නේ ද යන්න පිළිබඳව සමූහය විසින් ප්‍රති ඇගයුමක් කෙරේ. සමූහය විසින් පරිපාලිත සමාගමක පාලනය ලබාගත් කල්හි පරිපාලිත සමාගමේ ඒකාබද්ධවීම් ආරම්භ වන අතර සමූහයට පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් පවත්නා පාලනය ගිලිහී ගී යෑම සිදුවූ විට ඒකාබද්ධවීම් අවසන් වේ. සමූහය විසින් පරිපාලිත සමාගමේ පාලනය ලබාගන්නා දින සිට පරිපාලිත සමාගමේ පාලනය ගිලිහී යන දින දක්වා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල පරිපාලිත සමාගම විසින් වර්ෂයක් තුළ අත්පත් කරගන්නා හෝ ඉවත් කරන වත්කම්, වගකීම්, ආදායම් හෝ වියදම් ඇතුළත් විය යුතු ය.

ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායමට අයත් සෑම සංරචකයක්ම සමූහයේ පරිපාලකයේ කොටස් හිමියන් සහ පාලනය නොවන හිමිකම් වෙත ආරෝපණය කෙරේ. පාලනය නොවන හිමිකම්වල ඍණනා ශේෂයක් ඇති වුවද ඒ ආකාරයෙන් ම සිදු වේ. අවශ්‍ය අවස්ථාවන්හි දී, සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති හා පරිපාලිත සමාගම්වල ගිණුම් ප්‍රතිපත්ති සමඟ අනුරූප කිරීම් සඳහා පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලට ගැලපුම් සිදුකෙරේ.

පාලනය ගිලිහී යාම

සමූහයෙන්, එහි පරිපාලිතයක පාලනය ගිලිහී ගිය විට, අදාළ වත්කම් (කීර්ති නාමය ද ඇතුළුව), වගකීම්, පාලනය නොවන හිමිකම් හා ස්කන්ධවල කිසියම් සංරචක ඉවත් කරන අතර එයින් ප්‍රතිඵල වන්නා වූ ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයේ හඳුනාගත යුතුය. රඳවා ගනු ලැබූ කවර හෝ ආයෝජනයක් එහි සාධාරණ අගයට හඳුනා ගනී.

වර්ෂය තුළ සමූහයේ සහ එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධව ඇතුළත් මුළු ලාභ හා අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ හා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන අතර සමූහයේ සහ එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධව ඇතුළත් සියලු වත්කම් හා වගකීම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වේ.

පාලනය නොවන හිමිකම්

ලාභයේ හෝ අලාභයේ කොටසක් සහ සමූහය සතු නොවන ශුද්ධ වත්කම් පාලනය නොවන හිමිකම්වලින් නියෝජනය වන අතර එය ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වර්ෂයට අදාළ ලාභයේ සංරචකයක් ලෙස හා ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ මව් සමාගමේ කොටස්කරුවන්ට අදාළ ස්කන්ධයෙන් වෙන්ව ස්කන්ධයේ සංරචකයක් ලෙස දැක්වේ. සමාගමේ හා එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රවාහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහයට ඇතුළත් වේ.

ඒකාබද්ධ කිරීමේ දී ඉවත්කළ යුතු ගනුදෙනු

සියලු සමූහය අතර වත්කම්, වගකීම්, ස්කන්ධ, ආදායම්, වියදම් හා සමූහයේ සාමාජිකයන් අතර සිදුවන ගනුදෙනුවලට අදාළ මුදල් ප්‍රවාහ ඒකාබද්ධ කිරීමේ දී මුළුමනින්ම ඉවත් කළ යුතු ය. පාලනය ගිලිහී යාමකින් තොරව, පරිපාලිත සමාගමක අයිතිවාසිකම් හිමිකමෙහි වෙනස්වීමක් සිදුවුවහොත් එය ස්කන්ධ ගනුදෙනුවක් ලෙස සැලකිය යුතු ය.

2.9. ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති අයිතම මැනීමේදී ගැලපීම්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම අවශ්‍ය වේ. මෙම ප්‍රකාශ පදනම් වන්නේ ප්‍රවර්තන කරුණු සහ තත්ත්වයන් පිළිබඳ කළමනාකාරිත්වයේ දැනුම සහ එම දැනුම සහ අනාගත සිදුවීම් පිළිබඳ ව්‍යතිරේක මත පදනම් වූ උපකල්පන මතය. නත්‍ය ප්‍රතිඵලය නිරන්තරයෙන් එම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඉහළ මට්ටමේ විනිශ්චයන් හෝ සංකීර්ණත්වය සම්බන්ධ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර 2.10 සටහනේ අනාවරණය කර ඇත.

2.10. සුවිශේෂී ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ඇගයීම සඳහා විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන ගණනාවක් ගනුලැබේ.

I. ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී පහත විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සුවිශේෂී බලපෑමක් ඇති කෙරේ.

(අ) **විලම්බිත බදු වත්කම් හඳුනාගැනීම**

විලම්බිත බදු වත්කම් හඳුනාගැනීම කොතෙක් දුරට සිදුවන්නේද යන්න පාදක වනුයේ අනාගත බදු ආදායමට එරෙහිව විලම්බිත බදු වත්කම් භාවිතා කිරීමේ සම්භාවිතාව සම්බන්ධ තක්සේරුවකිනි.

II. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම හා ඇගයීම සම්බන්ධව වඩාත්ම සුවිශේෂී බලපෑමක් සිදුකරන ඇස්තමේන්තු හා උපකල්පන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(ඇ) ක්ෂය වන වත්කම්හි ප්‍රයෝජනවත් ආයු කාලය

වත්කම්වල අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත පදනම්ව, කළමනාකාරිත්වය විසින් ක්ෂය වන වත්කම්හි ප්‍රයෝජනවත් ආයු කාලය සම්බන්ධ සෑම වාර්තාකරණ දිනයකම ස්වකීය ඇස්තමේන්තු සමාලෝචනය කෙරේ. මෙම ඇස්තමේන්තුවල පවතින තාක්ෂණික යල්පැනීම් හා සම්බන්ධ අවිනිශ්චිතතාවයන් සමහරක් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණ උපකරණවල උපයෝගීතාවය වෙනස් කරනු ඇත.

(ආ) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම්හි වර්තමාන අගය සාධක රාශියක් මත රඳා පවතින අතර එම සාධක නිශ්චය කරනුයේ ආයුගණක පදනම් මත උපකල්පන රාශියක් භාවිතයෙනි. නිර්වාචිත ප්‍රතිලාභ සැලසුමක් සඳහා වටිනම් අනුපාතිකය ද ඇතුළුව ශුද්ධ වියදම් හා බැඳීම් නිශ්චය කරගැනීමට භාවිතා කරන උපකල්පන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් අංක 25 මඟින් අනාවරණය කෙරේ. මෙම උපකල්පනවල යම් වෙනස්වීමක් සිදුවුවහොත් එය නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් බැඳීමෙහි ඉදිරි වටිනාකම් කෙරෙහි බලපානු ඇත.

(ඇ) වෙළඳ ලැබිය යුතු මුදල් හා කොන්ත්‍රාත් වත්කම් සඳහා අපේක්ෂිත ණය හානි සඳහා ප්‍රතිපාදන

වෙළඳ ලැබිය යුතු මුදල් හා කොන්ත්‍රාත් වත්කම් සඳහා අපේක්ෂිත ණය හානි ගණනය සඳහා සමූහය විසින් ප්‍රතිපාදන න්‍යාය‍යක් භාවිතා කරනු ලැබේ. ප්‍රතිපාදන අනුපාතික පාදක වනුයේ ඒකාකාර ලාභ ආකාරයක් සහිත විවිධ පාරිභෝගික ඛණ්ඩ සමූහ සඳහා කල්පසු වූ ණය සඳහා පසුවී ඇති දින ගණන මත ය.

ප්‍රතිපාදන න්‍යාය‍ය මුලින් පාදක වනුයේ සමූහයේ ඓතිහාසිකව නිරීක්ෂිත පැහැර හැරීම් අනුපාතික මතය. ඓතිහාසික ණය අලාභ සම්බන්ධිත අත්දැකීම් සමඟ ඉදිරි තොරතුරු ගැලපීම් සඳහා සමූහය විසින් න්‍යාය‍යේ ප්‍රමාණ නිගමනය කරනු ලැබේ. සෑම වාර්තාකරණ දිනයකදීම, ඓතිහාසිකව නිරීක්ෂිත පැහැර හැරීම් යාවත්කාලීන කරන අතර ඉදිරි ඇස්තමේන්තුවල වෙනස්වීම් විශ්ලේෂණය කරනු ලැබේ.

2.11. සංයුක්තනාත්මක තොරතුරු

වඩා නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා සහ ප්‍රවර්තන ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය හැකි පරිදි අවශ්‍ය පරිද්දෙන් පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම් හා වර්ගීකරණය සංශෝධනය කර තිබේ. එසේ වුවද, SLFRS 9 හා SLFRS 15හි විෂය පථය ඇතුළතසංයුක්තනාත්මක සංඛ්‍යා සමාගම විසින් නැවත ප්‍රකාශ කිරීමක් සිදුකර නොමැත.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

3.1. ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල වෙනස්වීම්

2018 ජනවාරි 01 සිට බලාත්මක නව ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීම හැර, මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයේ දී අනුගමනය කළ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල වේ.

සමූහය විසින් SLFRS 15 හා SLFRS 9 යන ප්‍රමිති පළමුවරට යොදා ගන්නා ලදී. මෙම නව ගිණුම්කරණ ප්‍රමිති යොදාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ වෙනස්කම්වල ස්වභාවය හා බලපෑම සටහන් අංක 38 හිදී විස්තර කර ඇත.

3.2. මූල්‍ය ලේඛන

3.2.1. මූල්‍යමය වත්කම්

3.2.1.1. 2018 ජනවාරි 01 වන දිනට පෙර අදාළ වූ ප්‍රතිපත්තිය

(අ) වර්ගීකරණය

සමූහය විසින් සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය මුල්හඳුනාගැනීමේ අවස්ථාවේ සිදුකරන අතර පහත දැක්වෙන ආකාරයට මූල්‍ය වත්කම් වර්ගීකරණය සිදුකෙරේ:

I. ණය සහ ලැබිය යුතු මුදල්
II. විකිණීමට ඇති මූල්‍ය වත්කම්

I.ණය සහ ලැබිය යුතු මුදල්

ණය සහ ලැබිය යුතු මුදල් යනු ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම්වක් සහිත සක්‍රීය වෙළඳ පොළේ මිල කියුම් ඉදිරිපත් නොවන ව්‍යුත්පන්න නොවන මුදල් වත්කම් වේ. ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානයට පසු කල් පිරෙන මාස 12ට වැඩි සුරුකුම්පත් හැරුණු කොට ණය සහ ලැබිය යුතු මුදල් ජංගම වත්කම් යටතට ගැනේ. වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයට ඇති වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්, කෙටි කාලීන තැන්පතු වල සිදු කළ ආයෝජන, අත්තිකාරම් සහ ආපසු ගෙවන

තැන්පතු, ආශ්‍රිත පාර්ශවවලින් ලැබිය යුතු මුදල්, ආශ්‍රිත පාර්ශව සඳහා ලබා දුන් ණය හා මුදල් හා මුදල් සමාන දෑ සමූහයේ ණය සහ ලැබිය යුතු මුදල්වලට අන්තර්ගත වේ.

II. විකිණීමට ඇති මූල්‍ය වත්කම්

විකිණීමට ඇති මූල්‍ය වත්කම් යනු මෙම කාණ්ඩයටම නිශ්චිත හෝ වෙනත් කිසිම කාණ්ඩයක් යටතේ වර්ගීකරණය නොවන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ආයෝජන කල්පිරීම් හෝ වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයට එනම් මාස 12ක් ඇතුළත එය ඉවත් කිරීමට කළමනාකාරිත්වය අදහස් කරන්නේ නම් හැර මෙම මූල්‍ය වත්කම් ජංගම නොවන මූල්‍ය වත්කම් යටතට ගැනේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වලට අන්තර්ගත වනුයේ දිගු කාලීන මිල කියුම්ලක්ස්කන්ධ ආයෝජන වේ.

(ආ) හඳුනාගැනීම සහ මූලික අවස්ථාවේ මිනුම්කරණය

ණය සහ ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය වන මූල්‍ය වත්කම්, සමූහය විසින් ගනුදෙනුව ආරම්භ කළ දිනට හඳුනා ගැනේ. සමූහය විසින් මූල්‍ය සාධන පත්‍රයේ ගිවිසුම්ගත ප්‍රතිපාදන සඳහා පාර්ශවයක් වූ දිනට අනිකුත් මූල්‍ය වත්කම් හඳුනා ගැනේ.

මූල්‍ය වත්කමක් මූලික අවස්ථාවේ සාධාරණ අගයට සහ එයට ලාභ හෝ අලාභ මඟින් වත්කම් සාධාරණ අගයටනොමැති අවස්ථාවක සෘජුව ආරෝපණය වූ ගනුදෙනු පිරිවැය එකතු කිරීම ඔස්සේ හඳුනාගැනේ.

මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමට තිබූ අයිතිය අවසන් වීම හෝ මාරු වීම සහ සමූහය විසින් මූල්‍ය වත්කමේ හිමිකමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැහෙනදුරට පවරා දීමක් සිදුවූ විට මූල්‍ය වත්කම් හඳුනාගැනීමඅත්හරිනු ලැබේ.

(ඇ) පසුව මිනුම්කරණය

I. ණය සහ ලැබිය යුතු මුදල්
මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ණය සහ ලැබිය යුතු මුදල් ක්‍රමක්ෂය කළ පිරිවැයට හානිකරණය සඳහා ප්‍රතිපාදන අඩු කර මිණුම්කරණය කෙරේ.

II. විකිණීමට ඇති මූල්‍ය වත්කම්
මුල්වර හඳුනාගැනීමෙන් අනතුරුව, විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර,ඇති මිල කියුම් සහිත ස්කන්ධ ආයෝජන සාධාරණ අගය මත මිනුම්කරණය කෙරේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම්හි සාධාරණ අගයේ සිදුවන වෙනස් කම් අනිකුත් විස්තීර්ණ ආදායම්වලදී හඳුනාගන්නා අතර ස්කන්ධ ප්‍රවාහ වෙනස් වීමේ ප්‍රකාශයේ විකිණීම සඳහා සංචිත ලෙස ඉදිරිපත් කෙරේ. සමූහයේ ක්‍රමෝපායික ආයෝජන ලෙස සැලකෙන මිල කියුම් රහිත ස්කන්ධ ප්‍රවාහ ආයෝජන සඳහා වර්තමාන සාධාරණ අගය විශ්වාසනීය අයුරින් ඇස්තමේන්තු කළ නොහැකි බැවින්, හානිකර පාඩුවක් ඇතොත් එය අඩුකර පිරිවැයට මිනුම්කරණය කෙරේ.

(ඇ) මූල්‍ය වත්කම් හානිකරණය

I. ක්‍රමක්ෂය පිරිවැයටපවත්වාගෙන යන වත්කම්
සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම සමූහය විසින් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්දැයි තක්සේරු කෙරේ. වත්කමක් මුල්වරට හඳුනාගැනීමෙන් පසු සිදු වූ එක් සිද්ධියක් හෝ සිද්ධි ගණනාවක ප්‍රතිඵලය වශයෙන් (අලාභ සිදුවීම) සහ එම අලාභ සිදුවීම (හෝ සිදුවීම්) මූල්‍ය වත්කම්වල විශ්වාසනීය අයුරින් ඇස්තමේන්තු කළ හැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත බලපෑමක් සිදුකරයි නම් හානිකරණය වූ බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කමක් හානි වී ඇති බව සහ හානිකරණ පාඩු දැරීම සිදු කෙරේ.

ක්‍රමක්ෂය කළ පිරිවැයක පවතින ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයේ අගය මිනුම්කරණය කරනුයේ වත්කමේ ධාරණ අගය සහ මූල්‍ය වත්කම්හි මුල් බලාත්මක පොලී අනුපාතිකය මත වට්ටම් කළ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය (දැනට දරා නොමැති අනාගත ණය හානි) අතර වෙනස ලෙසිනි. මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩුවන අතර, අලාභයේ වටිනාකම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

ඉන්පසු කාල පරිච්ඡේදයක දී හානිකරණ අලාභය අඩු වී, එම අඩුවීම හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදුවූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ කළහැකි නම්, එකී පෙර හඳුනාගත් හානිකරණ අලාභයේ ප්‍රතිවර්තනය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

II. විකිණීමට ඇති මූල්‍ය වත්කම්

සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම සමූහය විසින් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්දැයි තක්සේරු කෙරේ. මීල කියුම් සහිත ස්කන්ධ ආයෝජන සඳහා, ආයෝජනවල සාධාරණ අගයේ එහි පිරිවැයටත් වඩා අඩු අගයක වන සුවිශේෂී හෝ දීර්ඝකාලීන අඩුවීමක් පැවතීම වත්කම් හානි වීඇති බවට තවත් සාක්ෂියකි. මීල කියුම් සහිත ස්කන්ධ ආයෝජන සඳහා එවැනි සාක්ෂි පවතී නම්, අත්පත් කරගැනීමේ පිරිවැයත් සහ ප්‍රතිවර්ගීකරණ ගැලපුමක් ලෙස පෙර ලාභයේ හෝ අලාභයේ හඳුනාගත් නැවත ස්කන්ධයේ සිට ලාභ හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය වූ හානිකරණ අලාභය අඩු කරනු ලැබූ වර්තමාන සාධාරණ අගයක් අතර වෙනස සමුච්චිත අලාභය ලෙස මිනුම්කරණය කෙරේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය වූ ස්කන්ධ ප්‍රවාහ ආයෝජනයක ලාභයේ හෝ අලාභයේ හඳුනාගනු ලබන හානිකරණ අලාභ, ලාභ හෝ අලාභ හරහා ප්‍රතිවර්තනය කළ හැක. අදාළ ප්‍රතිවර්ත්‍ය වටිනාකම් අනෙකුත් විස්තීරණ ආදායම් තුළ හඳුනාගනු ලැබේ.

මීල කියුම් රහිත ස්කන්ධ ආයෝජන සඳහා, ආයෝජනවල සාධාරණ අගයේ එහි පිරිවැයටත් වඩා අඩු අගයක වන සුවිශේෂී හෝ දීර්ඝකාලීන අඩුවීමක් පැවතීම වත්කම් හානි වීඇති බවට තවත් සාක්ෂියකි. මීල කියුම් රහිත ස්කන්ධ ආයෝජන සඳහා එවැනි සාක්ෂි පවතී නම්, අලාභයේ අගය මිනුම්කරණය කරනුයේ මූල්‍ය වත්කමේ ධාරණ අගය සහ එවැනි සමාන මූල්‍ය වත්කමක් සඳහා වෙළඳ පොළ ඉපැයුම් අනුපාතිකය මත වර්ථමාන කළ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය අතර වෙනස ලෙසිනි. එවැනි හානිකරණ අලාභ ප්‍රතිවර්තනය කළ නොහැක.

3.2.1.2. **2018 ජනවාරි 01 දිනෙන් පසු අදාළ වන ප්‍රතිපත්තිය**

අ. මූල්‍ය සාධන පත්‍ර - මූල් අවස්ථාවේ හඳුනා ගැනීම හා පසුව සිදුවන මිනුම්කරණය

මූල්‍ය සාධන පත්‍රයක් යනු එක් අස්තිත්වයකට මූල්‍ය වත්කමක් ජනිත කරන්නාවූත්, අනෙක් අස්තිත්වයට මූල්‍ය වගකීමක් හෝ ස්කන්ධ සාධන පත්‍රයක් ඇතිකරන්නාවූත් ගිවිසුමකි.

I. මූල්‍ය වත්කම්

මූල් අවස්ථාවේ හඳුනාගැනීම හා මිනුම්කරණය

මූල්‍ය වත්කම් මූල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී වර්ගීකරණය කරන අතර පසුව ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ.

මූල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය මූල්‍ය වත්කම්හි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය සඳහා වන සමූහයේ ව්‍යාපාරික ආකෘතිය මත රඳා පවතී. සැලකිය යුතු මූල්‍යමය සංරචකයක් අඩංගු නොවන හෝ ඒ සඳහා සමූහය විසින් ප්‍රායෝගික උචිත මාර්ගයක් යොදා ගන්නා වෙළඳ ලැබිය යුතු හැරුණු විට, සමූහය විසින් මූල් අවස්ථාවේ දී මූල්‍ය වත්කම් ඒවායේ සාධාරණ අගයට එකතු කර, සාධාරණ අගයේ නොමැති මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ, ගනුදෙනු පිරිවැය ඔස්සේ මිනුම්කරණ කෙරේ. සැලකිය යුතු මූල්‍යමය සංරචකයක් අඩංගු නොවන හෝ ඒ සඳහා සමූහය විසින් ප්‍රායෝගික උචිත මාර්ගයක් යොදා ගන්නා වෙළඳ ලැබිය යුතු දැ SLFRS 15 යටතේ නිශ්චය කරන ගනුදෙනු පිරිවැයට මිනුම්කරණය කෙරේ. ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් ලැබෙන අයභාරය සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් කොටස බලන්න.

මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට හෝ විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණය වර්ගීකරණය හා මිනුම්කරණය සඳහා එකී මූල්‍ය වත්කම විසින් ගෙවීමට ඇති මුල් මුදල සම්බන්ධිත 'මුල් මුදල හා ඒ මත වන පොළිය (SPPI)පමණක් ගෙවීම' සිදුවන මූල්‍ය ප්‍රවාහ ඇති කළ යුතු ය. මෙම තක්සේරුව SPPI ලෙස හැඳින්වෙන අතර සාධන පත්‍ර මට්ටමේ දී එය සිදුකරනු ලැබේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමූහයේ ව්‍යාපාරික ආකෘතිය යන්නෙන් අදහස් කරනුයේ මුදල් ප්‍රවාහ ඇතිවීම සඳහා සමූහය විසින් එහි මූල්‍ය වත්කම් කළමනාකරණය කරනුයේ කෙසේ ද යන්න වේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ මේ දෙයාකාරයෙන්ම මුදල් ප්‍රවාහ ඇතිවන්නේ ද යන්න ව්‍යාපාර ආකෘතිය මඟින් නිශ්චය කෙරේ.

වෙළඳපොළේ පවත්නා රෙගුලාසි හෝ සාමාන්‍ය සම්ප්‍රදාය මඟින් නිශ්චිත නියමිත කාල රාමුවක් තුළ දී භාරදිය යුතු මිලට ගනු ලබන හෝ විකුණනු ලබන මූල්‍ය වත්කමක් වෙළඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. එනම් සමූහය විසින් වත්කම මිලදී ගනු ලබන හෝ විකිණීම සිදුකරනු ලබන දිනය වේ.

පසුව සිදුවන මිනුම්කරණය

පසුව සිදුවන මිනුම්කරණ කාර්යයන් සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ 04ක් යටතේ වර්ගීකරණය කෙරේ:

- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)
- සමුච්චිත වාසි සහ පාඩු (ණය සාධන පත්‍ර) යළි සැකසීමත් සමඟ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට වන මූල්‍ය වත්කම්
- ඉවත් කිරීමෙන් පසු යළි සැකසීමක් නොවන සමුච්චිත වාසි සහ පාඩුවල අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණව අගයට නියම කරන මූල්‍ය වත්කම්(ස්කන්ධ සාධන පත්‍ර)
- ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කම්

පහත කොන්දේසි දෙකම සපුරාලන මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කෙරේ.

> ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස් කිරීම සඳහා වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාර ආකෘතියක් තුළ මූල්‍ය වත්කම රඳවා ගැනීම.
>
> මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මඟින් නිශ්චිත දිනවල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවිය යුතු වන පොළියෙන් පමණක් සමන්විත වීම.

ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය වන මූල්‍ය වත්කමක් ඒ සඳහා ඍජුව ආරෝපණය වන ප්‍රවාහන පිරිවැය එකතුව සාධාරණ අගයට මුලින් හඳුනාගැනේ. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් පසු, අවශ්‍ය වෙනොත් හානිකරණ පාඩු අඩුකර, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය වන මූල්‍ය වත්කමේ ධාරණ අගය සඵල පොලී අනුපාතික ක්‍රමය යටතේ නිශ්චය කෙරේ.

වත්කමක් ඉවත් කිරීම, විකරිත හෝ හානිකරණය වූ විට, වාසි සහ පාඩුවීම ලාභ හෝ අලාභ වශයෙන් හඳුනාගනී.

මූල්‍ය වත්කම්වල ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් අයෝජන කළඹ මට්ටමේ අන්තර්ගතවන ව්‍යාපාරික ආකෘතියේ අරමුණ සම්බන්ධයෙන් සමූහය විසින් ඇගයීමක් සිදුකරයි. ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය හා කළමනාකාරිත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමඟින් මනාව නිරූපණය වීම මීට හේතුවයි. අවධානයට ගනු ලබන තොරතුරු වනුයේ:

- දක්වා ඇති ප්‍රතිපත්ති හා අයෝජන කළඹේ අරමුණු හා ප්‍රායෝගික වශයෙන් එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ආකාරය. කළමනාකරණ ක්‍රමෝපාය අවධානය යොමු කරනුයේ ගිවිසුම්ගත හිමිකම් ආදායම ඉපැයීමට ද, යම් නිශ්චිත හිමිකම් අනුපාතික කළඹක් පවත්වාගෙන යෑමට ද, යම් සම්බන්ධිත වගකීම් හෝ අපේක්ෂිත මුදල් ප්‍රවාහ කාලසීමාව මූල්‍ය වගකීම්වල කාලසීමාවට ගැලපීම හෝ වත්කම් විකිණීම හරහා මුදල් ප්‍රවාහ උපලබ්ධි කර ගැනීමට ද යන්න මීට ඇතුළත් වේ;
    - ආයෝජන කළඹේ කාර්යසාධනය ඇගයීම සිදුකරන්නේ කෙසේ ද හා සමූහයේ කළමනාකාරිත්වයට එය වාර්තා කිරීම;
    - ව්‍යාපාරික ආකෘතියේ (සහ ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම්) කාර්ය සාධනය කෙරෙහි බලපෑ හැකි අවදානම් හා එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්න;
    - ව්‍යාපාරයේ කළමනාකරුවන් සඳහා වැටුප් ගෙවීම කරන්නේ කෙසේ ද - උදා. වැටුප් ගෙවීම පදනම් වනුයේ කළමනාකරණය කරන වත්කම්වල සාධාරණ අගයට හෝ රැස්කරන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවලට ද යන්න; සහ
    - පූර්ව කාල පරිච්ඡේදවල මූල්‍ය වත්කම් විකුණුම්වල වාර ගණන, පරිමාව හා කාල නිශ්චය, එවැනි විකුණුම් සඳහා හේතු හා අනාගත විකුණුම් කාර්යය පිළිබඳ අපේක්ෂා.

යම්සමූහයේ වත්කම් බණ්ඩව හඳුනාගැනීමට අනුරූපව, ඉවත් කිරීම සඳහා සුදුසුකම් නොලබන ගනුදෙනුවල තෙවන පාර්ශව සඳහා මූල්‍ය වත්කම් පැවරීම මෙම කාර්යයේ දී විකුණුම් සඳහා සලකා නොලැබේ.

මූල්‍ය වත්කම් - ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු මූලික මුදල හා ඒ මත වන පොළිය පමණක්දැයි තක්සේරු කිරීම

මෙම ඇගයීමේ කාර්යය සඳහා, මූල්‍ය වත්කමක මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී ඇති සාධාරණ අගය'මූලික මුදල'ලෙස අර්ථ දැක්වේ. 'පොලිය'ලෙස අර්ථ දැක්වෙනුයේ මුදල්වල කාලීන අගය සඳහා ප්‍රතිඵලයාව හා කිසියම්

කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මූලික මුදල හා බැඳි ණය අවධානමත්, අනෙකුත් මූලික ණය දීමේ අවධානම් හා පිරිවැය (උදා. ද්‍රවශීලතා අවදානම හා පරිපාලන වියදම්) සේම ලාභ සීමාව වේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු මූලික මුදල හා ඒ මත වන පොළිය ගෙවීම පමණක් දැයි තක්සේරු කිරීමේ දී, සමාගම විසින් සාධන පත්‍රයේ ගිවිසුම්ගත කොන්දේසි පිළිබඳව අවධානය යොමු කෙරේ. මූල්‍ය වත්කම තුළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ කාලීනත්වය හෝ ප්‍රමාණය වෙනස් කළ හැකි ගිවිසුම්ගත කොන්දේසියක් තිබේද යන්න හා ඒ අනුව මෙම කොන්දේසිය සපුරාලිය නොහැකිබවට ඇගයීම් මීට ඇතුළත් වේ. මෙම ඇගයීම සිදු කිරීමේ දී, සමාගම විසින් පහත කරුණු සලකා බැලේ:

- මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම හෝ කාල සැකසුම් වෙනස් කළ හැකි අනිශ්චිත සිදුවීම්;
- විචල්‍ය අනුපාතික ලක්ෂණ ද ඇතුළුව ගිවිසුම්ගත කූපන් අනුපාතිකය ගැලපුම් කරන කොන්දේසි;
- පූර්වගෙවීම් සහ දිගුකිරීම් ලක්ෂණ; සහ
- නිශ්චිත වත්කම්වලින් වන මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම සීමා කරන කොන්දේසි (උදා. සහනදායී නොවන ලක්ෂණ)

ගිවිසුම නියමිත කාලයට කලින් අවසන් කිරීම සඳහා සාධාරණ අතිරේක ප්‍රතිඵලයක් ඇතුළත්ව තිබිය හැකි, පූර්ව වශයෙන් ගෙවූ මුදල මඟින් ගෙවීමට ඇති මූලික මුදල් මත නොගෙවූ මූලික මුදල් හා පොළිය සැහෙන දුරට නියෝජනය වේ නම්, පූර්වගෙවීම් ලක්ෂණය මූලික ගෙවීම් හා පොළිය පමණක් ගෙවීම් යන නිර්ණායකය සමඟ අනුරූපී වේ. මීට අමතරව, මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මුහුණත් අගය මත වටිටමක් හෝ අධිමීලක් යටතේ අත්පත් කරගත් විට, එකී ලක්ෂණය විසින් පූර්ව ගෙවීම් සැහෙන දුරට ගිවිසුම්ගත මුහුණත් අගයට උපචිත (නමුත් නොගෙවූ) ගිවිසුම්ගත හිමිකම (කලින් අවසන් කිරීමට සාධාරණ අතිරේක ප්‍රතිඵලයක් අවශ්‍ය කෙරෙන) අගයක් වීමේ අවසරය හෝ අවශ්‍යතාවයක් ඇතිවන අතර, පූර්ව ගෙවීම් ලක්ෂණයේ සාධාරණ අගය මූලික අවස්ථාවේ හඳුනාගැනීමේදී නොසැලකිය යුතු අගයක් වේ නම් මෙම නිර්ණායකය සමඟ අනුරූපී යැයි සැලකේ.

අ. මූල්‍ය වත්කම් ඉවත් කිරීම්
පහත අවස්ථාවන්හි දී මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන පරිද්දෙන්, මූල්‍ය වත්කමක කොටසක් හෝ එවැනි සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක්) මූලික වශයෙන් ඉවත් කිරීම සිදුකරනු ලැබේ.

- මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වීම; හෝ
- සමූහය විසින් මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරනු ලැබීම හෝ ලැබූ මුදල් ප්‍රවාහ පූර්ණ වශයෙන් කිසිදු ප්‍රමාදයකින් තොරව කෙවන පාර්ශවයකට පැවරෙන සැලැස්මක් සඳහා සමූහය විසින් බැඳීමක් ඇතිකර ගෙන තිබීම; සහ නැතහොත්

(අ) සමූහය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් පවරා තිබීම, හෝ
(ආ) සමූහය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් පැවරීම හෝ රඳවා ගැනීම සිදු නොකර, එනමුත් වත්කමේ පාලනය පවරා ඇති අවස්ථා

සමූහය විසින් මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරා ඇතිවිට හෝ කෙවන පාර්ශවයකට පැවරෙන සැලැස්මක් සඳහා අවකිර්ණ වී ඇති අවස්ථාවක, සමූහය විසින් එසේ නම්, කුමන ප්‍රමාණයකට හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගෙන තිබේ දැයි ඇගයීම් කළ යුතු ය. සමූහය විසින් වත්කමක සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් පැවරීමක් හෝ රඳවා ගැනීමක් සිදුනොකළ විට හෝ වත්කමේ පාලනය පැවරීමක් හෝ නොකළ විට, සිය අඛණ්ඩ සහභාගිත්වයේ විපසරිය දක්වා පැවරූ වත්කම් හඳුනාගැනීම් අඛණ්ඩව සිදුකරනු ලැබේ. එම අවස්ථාවේ දී, ආශ්‍රිත වගකීම ද සමූහය විසින් හඳුනාගනී. සමූහය විසින් රඳවාගනු ලැබූ අයිතිවාසිකම් හා බැඳීම් පිළිබිඹු වීමේ පදනම මත පැවරූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මිනුම්කරණය කරනු ලැබේ.

පැවරූ වත්කමක් සම්බන්ධයෙන් භාරකාරත්වය ආකාරයේ අඛණ්ඩ දායකත්වයක් වත්කමේ මුල් ධාරණ අගයේ අඩු අගයට හා සමූහය විසින් නැවත ගෙවීම අවශ්‍ය කරන ප්‍රතිඵලයේ ඉහළ අගයට මිනුම්කරණය කෙරේ.

ආ. මූල්‍ය වත්කම් හානිකරණය
සමූහය විසින් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ සියලු ණය සාධන පත්‍ර වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ අලාභයක් හඳුනාගනී. ගිවිසුම් හා අනුකූලව ලැබිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ සහ මුල් සඵල පොලී අනුපාතිකයේ ආසන්න අගයකට වටිටම් කරන ලද සමූහය විසින් ලැබීමට අපේක්ෂිත සියලුම මුදල් ප්‍රවාහයන්ගේ වෙනස මත අපේක්ෂිත ණය අලාභ පදනම් වේ. රඳවා ගනු ලැබූ ඇපකර විකිණීමෙන් හෝ ගිවිසුම්ගත කොන්දේසිවලට අත්‍යවශ්‍යක අංගයක් ලෙස වන අනෙකුත් ණය පුළුල් කිරීම්වලින් ලැබූ මුදල් ප්‍රවාහ අපේක්ෂිත මුදල් ප්‍රවාහවලට අන්තර්ගත වේ.

අදියර දෙකක් යටතේ අපේක්ෂිත ණය අලාභ හඳුනාගනී. මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු ඉහළ යෑමක් නොමැකි ණය නිරාවරණය වීම් සඳහා, ඉදිරි මාස 12 තුළ සිදුවිය හැකි ණය පැහැරහැරීමේ අවස්ථාවලින් ප්‍රතිඵල වන ණය හානි සඳහා අපේක්ෂිත ණය අලාභ ලබා දේ (මාස 12 ක් සඳහා අපේක්ෂිත ණය අලාභ). මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු ඉහළ යෑමක් ඇති ණය නිරාවරණය වීම් සඳහා, ඉදිරි ඉතිරි කාල සීමාව

තුළ අපේක්ෂා කරන ණය හානි සඳහා ණය පැහැර හැරීමේ අවස්ථාවල කාල නිශ්චය කිරීමකින් තොරව ණය අලාභ අවශ්‍ය කෙරේ (ආයු කාලය පුරාපවතින අපේක්ෂිත ණය අලාභ).

වෙළඳ ලැබිය යුතු හා කොන්ත්‍රාත් වත්කම් සඳහා, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ දී සමූහය විසින් සරල ප්‍රවේශයක් උපයෝගී කර ගනී. එනිසා, ණය අවදානම් පසුපස වීමසිලිමත් වීමක් වෙනුවට, සමූහය විසින් සෑම වාර්තාකරණ දිනයක දීම ආයු කාලය පුරා පවතින අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ණය අලාභයක් හඳුනාගනී. ඓතිහාසික ණය හානි පිළිබඳ අත්දැකීම් සම්බන්ධිතව ණය ගැතියන්ට විශේෂිතව හා ආර්ථික පරිසරයට අදාළව සුවිශේෂී ඉදිරි සාධකවලට ගැලපුම් කර සමූහය විසින් ප්‍රතිපාදන න්‍යාසයක් ස්ථාපනය කරනු ලැබේ.

අනෙකුත් ණය සාධන පත්‍ර සඳහා, සමූහය විසින් අවම ණය අවදානම් සරල කිරීමක් උපයෝගී කරගනී. සෑම වාර්තාකරණ දිනයක දීම, නොනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් රහිතව, පවතින සියලුම සාධාරණීය හා ආධාරකයක් විය හැකි තොරතුරු භාවිතා කරමින් ණය සාධන පත්‍රය අවම ණය අවදානමක් සහිත දැයි ඇගයීම සමූහය විසින් සිදුකරනු ලැබේ. මෙම ඇගයීම සිදුකිරීමේ දී, සමූහය විසින් ණය සාධන පත්‍රයේ අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම නැවත තක්සේරු කිරීම සිදු කරනු ලැබේ. මීට අමතරව, ගිවිසුම්ගත ගෙවීම් සම්බන්ධයෙන් දින 30කට වඩා වැඩි කාලයකට ගෙවීමේ කාලය ඉක්ම වී ඇති අවස්ථා වලදී ණය අවදානමේ සැලකිය යුතු ඉහළ යෑමක් පවතින්නේ ද යන්න සමූහය විසින් සලකා බලනු ලැබේ.

ගිවිසුම්ගත ගෙවීම් සම්බන්ධයෙන් දින 90කට වඩා වැඩි කාලයකට ගෙවීමේ කාලය ඉක්ම වී ඇති අවස්ථා වලදී, සමූහය විසින් ගෙවීම් පැහැර හැර ඇති මූල්‍ය වත්කම් සැලකිල්ලට ගනු ලැබේ. නමුත් ඇතැම් සිද්ධි වලදී, සමූහය විසින් දරා සිටින ණය පුළුල් කිරීම් පිළිබඳව සැලකිල්ලට ගනු ලැබීමට පෙර, ගෙවීමට නියමිත ගිවිසුම්ගත එටීනාකම පූර්ණ වශයෙන් ලැබීම සිදුනොවන බවට අභ්‍යන්තර හෝ බාහිර තොරතුරු මඟින් ඇහවීමේ දී සමූහය විසින් ද පැහැර හැරීමට නියමිත මූල්‍ය වත්කම් පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

පැහැර හැරීමේ අවදානමේ වෙනසක් ඇත්දැයි නිර්ණය කිරීම සඳහා, පහත සාධක සැලකිල්ලට ගත යුතු ය:

- මූල්‍ය වත්කමේ බාහිර ණය ශ්‍රේණිගත කිරීම
- අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම
- විකුණුම්හි අඩුවීම, කාරක ප්‍රාග්ධනයේ අඩුවීම, වත්කම් හීනවීම සහ බලපෑම් ඉහළ යෑම වැනි මෙහෙයුම් ප්‍රතිඵල
- මව් සමාගමෙන් හෝ ආශ්‍රිත සමාගම්වෙතින් ලැබෙන මූල්‍ය සහායේ අඩුවීමක්
- රාජකාරී පැහැර හැරීම් (නිසිකළ ඉක්ම වූ තොරතුරු)

3.2.2. මූල්‍ය වගකීම්

2018 ජනවාරි 01 දිනට පෙර අදාළ වූ ප්‍රතිපත්තිය

(ඊ) බැංකු සුරක්ෂණ ඇපයක් ලබා ගෙන පමණක් ණය පදනම් යටතේ ආනයනික සහල් නිකුත් කිරීම සඳහා ගිවිසුම්ගත වූ පෞද්ගලික ආයතනයක් වෙත ඊට පටහැනිව ණය පදනම් මත සහල් විකුණා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම සමාගමෙන් රු. 5,574,811 ක් අයවිය යුතුව තිබුණි.

(උ) 2010 අගෝස්තු 26 දිනැති අංක 2010/1753/34 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව එවකට සිටි සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව 2007 පෙබරවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි විධායක මට්ටමේ වැඩබලන ලද නිළධාරීන් තිදෙනෙකු උක්ත වැඩ බැලීමේ තනතුරුවල ස්ථීරව පිහිටුවීමට තීරණය කර තිබුණු බව දක්වා තිබුණද නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු තුල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාදෙන ලද ලිපිවල මුල් පිටපත් ඇතුලත් වී නොතිබුණි. එසේම හිඟ වැටුප් හා හිඟ වැටුප් වර්ධක ලෙස ගණනය කරන ලද රු. 11,511,088 ක් සමාලෝචිත වර්ෂයේදී එනම් එවක සිටි අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට වසර 08 කට පසු වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය හා සංස්ථා සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණු අතර එම ගෙවීම් සඳහා බලය දුන් හා අනුමැතිය ලබාදුන් නිලධාරීන් අතර මෙම ගෙවීම් ලබාගත් නිලධාරීන් දෙදෙනෙක් ද විය. එසේම මෙම නිලධාරීන් දෙදෙනා ඔවුන් වැඩ භාරගනමට ලක්ව සිටි කාලපරිච්ඡේදයට අදාල හිඟ වැටුප් හා හිඟ වැටුප් වර්ධක වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා සංස්ථා සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව වරින් වර රු.3,718,552 ක් විදුසුත් බැංකු ක්‍රමය හරහා ලබාගෙන තිබුණි.

(ඌ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද එය කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි.

(එ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය කළමණාකරණ ශ්‍රේණියේ තනතුරු 21 කින්ද, කළමණාකරණ සහකාර මට්ටමේ තනතුරු 51 කින්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 247 ක්ද වශයෙන් මුළු තනතුරු 319 කින් සමන්විත වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව 167 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 32 ක් විය. මෙම පුරප්පාඩු වලින් 09 ක් කළමනාකරණ ශ්‍රේණියේ තනතුරු සඳහා විය.

(ඒ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2021 අප්‍රේල් 20 වන දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

දුරකථන தொலைபேசி Telephone 2300585, 2435554 2435564, 2432273

ස.තො.ස கூ.மொ.தா C.W.E 57

ඊ මේල් ஈ மெயில் E-mail smatef.cwe@gmail.com

ෆැක්ස් பெக்ஸ் Fax 243 230 243

සමුපකාර තොග වෙළඳ සංස්ථාව
கூட்டுறவு மொத்த விற்பனைத் தாபனம்
THE CO-OPERATIVE WHOLESALE ESTABLISHMENT

1949 අංක 47, දරණ පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිතයි
1949 ஆம் ஆண்டு 47 இலக்க பாராளுமன்ற சட்டத்தின் கீழ் தாபிக்கப்பட்டது
(Established by act of parliament No. 47 of 1949)

සතොස මහලේකම් ගොඩනැගිල්ල, අංක 27, වොක්හෝල් වීදිය, කොළඹ 02.
சதொச செயலகக் கட்டிடம், இல .27, வொக்ஷொல் வீதி, கொழும்பு 02.
CWE Secretariat Building, No.27, Vauxhall Street, Colombo 02.

අපේ යොමුව எமது இல. Our Ref. .....

ඔබේ යොමුව உமது இல. Your Ref. .....

දිනය திகதி Date 2021.11.23

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)C වගන්තිය ප්‍රකාර
<u>විගණකාධිපති වාර්තාව</u>

2.2. මූල්‍ය ප්‍රකාශණ පිළිබඳව අදහස් දැක්වීම.

2.2.1. සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමණාකාරීත්වය විසින් තක්සේරු කරනු ලබන අතර, අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා අවශ්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමට පත්වීමට හැකි බව ප්‍රකාශ කර සිටිමි.

2017/2018 වර්ෂ වල රජයේ අවශ්‍යතාව සඳහා පිරිවැයට වඩා අඩු මුදලකට සහල් ආනයනය කර අලෙවි කිරීමට සංස්ථාවට සිදු වූ අතර, ඒ වෙනුවෙන් මහජන බැංකුව වෙත ගෙවිය යුතු ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් 2021 ජූලි මස සිට වාරික 60 න් ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. සංස්ථාවට අය විය යුතු ඉතිරි මුදල් සම්බන්ධව අදාල පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගෙන තිබේ. ලංකා සතොස ආයතනය විසින් ද ඉහත ව්‍යාපෘතිය යටතේ සංස්ථාවෙන් මිළට ගත් සහල් වෙනුවෙන් මුදල් ගෙවීම 2021.11.15 දින සිට ආරම්භ කර ඇත.

කළමණාකාරීත්වය විසින් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව නිරන්තර අවධානය යොමු කරන අතර, පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන් ගැනීමට අවශ්‍ය සියළුම ක්‍රියා මාර්ග ගනු ලබන බව ද, ඒ සම්බන්ධ අවශ්‍ය උපදෙස් මහා භාණ්ඩාරය හා වෙළඳ අමාත්‍යාංශය වෙතින් ලබා ගන්නා බව ද කාරුණිකව දැනුම් දෙමි.

2.2.2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම.

(අ) ශ්‍රී.ල.ගි.ප්‍ර.08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි

දක්වා ඇති කරුණු සම්බන්ධව එකඟතාවය පල කරමි. ඒ අනුව 2017 වසර සඳහා ගණනය කරන ලද කෙටුම් කුලී මුදල රු.290,802,512/- ක් වන අතර, 2018 වසරේදී එම මුදල රු.38,598,256.86 ක් වේ. ගණනය කිරීම් සම්බන්ධ තොරතුරු විගණන අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධ සංක්ෂිප්ත වාර්තාවක් **ඇමුණුම 01** හී දක්වා ඇත.

(ආ) ශ්‍රී.ල.ගි.ප්‍ර.16 - දේපළ පිරියත හා උපකරණ

(i) සමූපකාර තොග වෙළඳ සංස්ථාව සතුව විශාල දේපළ ප්‍රමාණයක් ඇති අතර, ඒවා ලංකාව පුරාම පිහිටා ඇත. සෑම වසර 05 පසුව අප විසින් එම දේපළ වරලත් තක්සේරුකරුවෙකු මගින් ප්‍රත්‍යාගණනය කිරීම සිදු කරනු ලබයි. එමගින් සතොස සතු සියළුම නිශ්චල, චංචල දේපළ වල අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් කාලසීමාව, වෙළඳපොළ අගය මත තක්සේරු කරයි.

මෙම කටයුතු සෑම වසරකම සිදු කිරීමේදී ලංකාව වටා ඇති සංස්ථාව සතු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ගතවන කාලය සහ පිරිවැය පිළිබඳව සළකා බැලීමේදී එම කටයුත්ත වසරක් පාසා සිදු කිරීම ප්‍රායෝගිකව අපහසු වන බැවින්, ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව ස්ථාවර වත්කම් වර්ෂ 3 -5 අතර කාලයක් තුල ප්‍රත්‍යාගණනය කිරීමට සංස්ථාව විසින් කටයුතු කරගෙන යනු ලබයි.

(ii) 2019 වසරේ සිට මූල්‍ය ප්‍රකාශණ වල සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් වල ධාරණ අගය හෙළිදරව් කිරීමට පියවර ගෙන ඇත.

2.2.3. ගිණුම්කරණ අඩුපාඩු

(අ) කොළඹ සංසරාජ මාවතේ පිහිටි රු.60,000/- ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සංස්ථාව විසින් කිසිදු පිරිවැයක් දරා නොමැත. සංස්ථාවේ ඉඩම කුළියට ගත් පාර්ශ්වයක් විසින් මෙම කොටස ඉදි කර තිබේ. එම පාර්ශ්වය මෙම ඉඩමෙන් ඉවත්ව ගොස් වසර ගණනාවක් ගත වී ඇත.

මෙම වත්කමේ පාලනය සංස්ථාව සතුවන අතර, අද දින වන විට මෙම වත්කම කුලියට දීමෙන් සංස්ථාව ආදායම් උපදවා ගැනීමට කටයුතු කර තිබේ. යම් දේපළක් පාලනය කිරීමට අයිතිය ඇත්නම්, එම දේපළෙන් ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ලැබේ නම් සහ දේපළ පිරිවැය හෝ වටිනාකම නිශ්චිතවම ගණනය කර ගැනීමට හැකි නම් එම දේපළ, වත්කම් ලෙස හඳුනා ගැනීමට ගිණුම්කරණ ප්‍රමිත අනුව සංස්ථාවට හැකියාව තිබේ.

මෙම වත්කම සඳහා සංස්ථාව පිරිවැයක් නොදැරුව ද 2015 වත්කම් ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවේදී එම තක්සේරුකරු විසින් අදාල ගොඩනැගිල්ල තක්සේරු කළ වටිනාකම වන රු.60,000/- ආයතනයේ වත්කමක් ලෙස පොත් වල ගිණුම්ගත කිරීම සිදු කර ඇත. ඒ අනුව අද වන විට සංස්ථාව මෙම ගොඩනැගිල්ල වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම් වල නිරූපණය කිරීම නිවැරදි බව ප්‍රකාශ කරමි.

මෙම වත්කම මත වැඩිපුර ගණනය කළ ක්ෂය ප්‍රමාණය 2019 වසරේ ගිණුම් තුලින් ගැළපීම් සිදු කර ඇත. මෙය ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස් වීමක් නිසා 2019 වසරේ ක්ෂය වෙන් කිරීම් තුලින් ගලපා ගිණුම් නිවැරදි කර තිබේ.

(ආ) මෙම ගොඩනැගිල්ල සඳහා සංස්ථාව විසින් කිසිදු පිරිවැයක් දරා නොමැත. 2015 වත්කම් ප්‍රත්‍යාගණනයේදී තක්සේරුකරු ලබා දී ඇති වෙළඳපළ අගය වන රු.360,000/- ගිණුම් වල වත්කම් ලෙස නිරූපණය කර තිබේ. මෙම ගොඩනැගිල්ල අද වන විට සංස්ථාවේ පාලනය යටතේ ආදායම් ඉපයීමට යොදාගෙන ඇත. එමනිසා මෙම ගොඩනැගිල්ල සම්බන්ධව තෙවන පාර්ශවයක් විසින් කිසිදු අයිතිවාසිකමක් නොදරණ බැවින් සහ එම ඉඩම සංස්ථාව සතු වන බැවින් ද, ගොඩනැගිල්ලේ පාලනය සංස්ථාව සතු බැවින් සහ එම ගොඩනැගිල්ලේ ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ලැබෙන බැවින ද, තක්සේරුකරු විසින් මෙම ගොඩනැගිල්ලේ වෙළඳපොළ වටිනාකම නිශ්චිතවම ගණනය කර දී ඇති බැවින් ද සංස්ථාව විසින් මෙම ගොඩනැගිල්ල සංස්ථාවේ වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර ඇත.

(ඇ) 2019 වසරේදී මෙම වරද නිවැරදි කර ගිණුම්ගත කර තිබේ.

(ඈ) භෞතික වටිනාකමක් නොමැති මෙම තොගය 2004 වර්ෂයේ සිට අඛණ්ඩව ගොඩනැගිලි ද්‍රව්‍ය තොගයක් ලෙස මූල්‍ය ප්‍රකාශණ වල සඳහන්ව තිබේ. මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශණ වලින් කපා හැරීමට නම් ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අවසර ලබා ගත යුතුවන අතර එතෙක් මෙම තොගය මූල්‍ය ප්‍රකාශණ වල සඳහන් කළ යුතුය. ඉදිරියේදී මෙම තොගය කපා හැරීම් කමිටුවට ඉදිරිපත් කර මහ භාණ්ඩාගාරයෙන් අවසර ලැබීමෙන් පසු ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරමි.

(ඉ) මෙම කරුණ සම්බන්ධව අප තක්සේරුකරු සමඟ සාකච්ඡා කරන ලදි. ඔහුගේ ප්‍රකාශයට අනුව ගිණුගත කරන ලද අගයන් සහ ස්ථාවර වත්කම් ලේඛණයේ සඳහන්ව ඇති අගයන් නිවැරදි වේ. තක්සේරු ලේඛණයේ සඳහන් අංක 07 හී දක්වා ඇති වර්ග ප්‍රමාණය 57.7 තක්සේරු කරන ලද්දේ රු. මිලියන 8 ට වන අතර, එය තක්සේරු ලේඛණයේ රු. මිලියන 7 ලෙස නිරූපණය කර ඇත. තක්සේරු ලේඛණයේ ඇත්තේ කෙටුම්පතක් වන අතර, එම ලේඛණය නිවැරදි කර ඉතා ඉක්මණින් සතොස වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා බව තක්සේරුකරු විසින් එකඟ වන ලදි. ඒ අනුව වාර්තාව ඉතා ඉක්මණින් විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. එසේම ස්ථාවර වත්කම් ලේඛණයේ දැක්වෙන වත්කම් වල අගයන් නිවැරදි බවත්, එම ශේෂ නිවැරදිව ගිණුම්ගත කර ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි.

(ඊ) මෙහි දක්වා ඇති පරිදි වර්ග අඩි 2944ක අගය වෙළඳපොළ අගය වූ රු.1,200/- ගණනය කර කෙටුම්පත් තක්සේරු වාර්තාවේ ඇතුළත් කර ඇත. නමුත් තක්සේරුකරු එම වාර්තාවේ තබා ඇති සටහන අනුව එවකට පැවැති තත්ත්වය අනුව කුලි අගයන් ගණනය කිරීමට නොහැකි බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව එම දේපළ රු. 400/- අගයකට තක්සේරු කර ඇත. මෙයද තක්සේරු වාර්තාවේ නිවැරදිව සටහන් නොවන අතර, ගිණුම්ගත කිරීම් හා වත්කම් ලේඛණයක් නිවැරදිව දක්වා ඇත. එමනිසා නිවැරදි කළ ලේඛණයක් ලබා දීමට තක්සේරුකරු විසින් එකඟ වූ අතර, අප විසින් ඉතා ඉක්මණින් එම වාර්තාව විගණන අංශය වෙත යොමු කරන බව කාරුණිකව දන්වා සිටින අතර, නිවැරදි ශේෂයන් ගිණුම්ගත කර ඇති බව ද දන්වා සිටිමි.

(උ) මේ යටතේ දක්වා ඇති ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක කුටිය සඳහා කේටුම්පත් තක්සේරු වාර්තාවේ සඳහන් තක්සේරු අගය රු. 475,300/-කි. සතොස මෝටර්ස් හී ඇති පාපැදි නැවතුම්හල සතොසට අයත් නොවන බව තක්සේරු වාර්තාවේ සඳහන්ව ඇත. එමනිසා එහි අගය වූ රු.25,000/- තක්සේරු වටිනාකම් ගිණුම් වලට එකතු කර නොමැත.

ආරක්ෂක කුටියේ වර්ග අඩි 280 වෙළඳපොළ අගය වන රු.1,697.50ක් ලෙස ගණනය කර තක්සේරු වාර්තාවේ ඇතුළත් කර තිබුණද පසුව වෙළඳපොළ අගය රු.1,225/- ලෙස අඩු කර ඇත. මෙම නිවැරදි කිරීම සිදු කර අදාළ වාර්තාව ඉතා ඉක්මණින් විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම නිවැරදි ශේෂයන් ගිණුම්ගත කර ඇති බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

(ඌ) කෙටුම්පත් වාර්තාව අනුව ප්‍රධාන කාර්යාලයේ වාහන ගාල් කිරීමේ අංගනය කිසිදු වටිනාකමක් නොමැතිව දක්වා තිබුණද, එහි වෙළඳපොළ වටිනාකම රු.50/ට තක්සේරු කර වර්ග අඩි 1890 සඳහා රු.94,500/- ලෙස ගිණුම්ගත කර ඇත. මෙම අගය නිවැරදි බවත්, නිවැරදි කළ තක්සේරු වාර්තාව ලබාදෙන බවත් තක්සේරුකරු විසින් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව මෙම නිවැරදි කිරීම සිදු කර අදාල වාර්තාව ඉතා ඉක්මණින් විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරණු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම නිවැරදි ශේෂයන් ගිණුම්ගත කර ඇති බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

(එ) ගිණුම්කරණ ප්‍රමිත අනුව ශේෂ පත්‍රය තුල වත්කමක් හඳුනා ගැනීමට නම් එම වත්කම නිසා අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒම සිදු විය යුතුය. එමෙන්ම එම වත්කමට විශ්වාසනීයව තහවුරු කළ හැකි පිරිවැයක් හෝ වටිනාකමක් තිබිය යුතුය.

මෙම වත්කම සඳහා සියළු මුද්දර ගාස්තු ගෙවා සතොස ආයතනයේ සින්නක්කර අයිතිය සඳහා එම කොටස වෙන්කර ඇත. මේ සඳහා ඔප්පු ලබා දීම සිදු කරනු ලබන්නේ ස්වාධිපත්‍ය කළමණාකරණ ආයතන මගින් වන අතර, විතානගේ මාවත අයිති ප්‍රදේශය සඳහා මෙතෙක් ඔප්පු නිකුත් කිරීම සිදු කර නොමැති බවත්, අනෙකුත් ඉඩම්හිමියන් කොටස් වශයෙන් ගෙවීම් සිදු කරණු ලබන බැවින්, සෑම අයිතිකරුවෙකුම ගෙවීම් සිදු කර අවසන් වූ පසු එකවර ඔප්පු ලබාදෙන බවත් එම ආයතනය අප වෙත දැණුම් දී ඇත. එමනිසා ඉහත දේපළ අයිතිය සංස්ථාව සතු බවට තහවුරු කිරීමේ ලේඛන සංස්ථාව සතුව ඇති අතර, මේ වන විට සංස්ථාව විසින් මෙම ගොඩනැගිල්ල භුක්ති විඳින බවත්, ඒ මත කුලී ආදායම් ලබන බවත් කාරුණිකව දන්වා සිටිමි.

ශේෂ පත්‍රය තුල වත්කමක් ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය මූලික කරුණු එමගින් සම්පූර්ණ වන අතර, එම වත්කම් සඳහා නිශ්චිත පිරිවැය ලෙස රු.12,600,000/- ක් ගෙවා ඇති බවට ලේඛන අප සතුව ඇත. එමෙන්ම ඒ මත ලැබෙන කුලී මුදල මගින් සංස්ථාව තුලට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදු වේ. එමනිසා මෙය සංස්ථාවට වත්කමක් වන බවත්, ඒ මත ගණනය කළ ක්ෂය මුදල නිවැරදිව අදාල වර්ෂය තුල ගිණුම්ගත කර ඇති බවත්, එය වැඩිපුර ගිණුම්ගත කරන ලද මුදලක් නොවන බවත් ප්‍රකාශ කර සිටිමි. තවද කුලි ආදායම් තුල මෙම වත්කම කුලියට දීමෙන් ලැබෙන ආදායම දක්වා ඇති අතර, ආදායමට සාපේක්ෂව එම වත්කම මත ගණනය කළ ක්ෂය වටිනාකමද ගිණුම්ගත කල යුතුය. එමනිසා මෙම වත්කම ගිණුම්ගත කිරීම නිවැරදිව සිදු කර තිබෙන බව දන්වා සිටිමි.

(ඒ) මෙහි සඳහන් අයිතම 15 මිළ ගණන් වල වෙළඳපොළ අගය පසුව නිවැරදි කර ඇති බවත්, මෙම ඉඩමේ අයිතිය වෙනත් පාර්ශවයක් සතුව පවතින බවත්, කොටුම්පත් තක්සේරු වාර්තාව ඒ අනුව නිවැරදි විය යුතු බවත් තක්සේරුකරු විසින් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව මෙම නිවැරදි කිරීම සිදු කර අදාළ වාර්තාව ඉතා ඉක්මණින් විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම නිවැරදි ශේෂයන් ගිණුම්ගත කර ඇති බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

(ඔ) මෙම කරුණ සම්බන්ධව 2021.03.16 දින පැවති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලදි. සාමාන්‍යාධිකාරී සතුව මෙම ගණුදෙනුවට අදාල කැබිනට් පත්‍රිකාව සමග අනෙකුත් ලිපි ඇති බව ප්‍රකාශ කරන ලදි. කමිටුව විසින් සාමාන්‍යාධිකාරී වෙත එම සියළු තොරතුරු ලංකා සතොස ආයතනය වෙත යොමු කරන ලෙසත්, එම තොරතුරු අනුව ලංකා සතොස ආයතනයට මෙම ගණුදෙනු ගිණුම්ගත කිරීමට අවශ්‍ය අනෙකුත් තොරතුරු වෙතොත් ඒවාද ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. ඒ අනුව මේ වන විට සාමාන්‍යාධිකාරී විසින් ලංකා සතොස ආයතනයට මෙම තොරතුරු ඉදිරිපත් කර ඇති බව සඳහන් කර සිටිමි. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරමි.

(ඕ) 2018 වර්ෂය තුල ගිණුම්ගත කළ යුතු රදවා ගැනීමේ බදු මුදල 2019 වසරේදී නිවැරදිව ගිණුම්ගත කර තිබේ. එම ගණනය කිරීම් වලට අදාල තොරතුරු විගණනයට යොමු කර තිබේ.

(ක) මෙම ශේෂය සකස් වී ඇත්තේ ඇමුණුම 02 පරිදිය. 2011 වසරේ සිට ලෙජරය තුල දක්වා ඇති ලැබිය යුතු පොළී ආදායම් ගිණුමේ ශේෂය රු.1,039,739/- ඒ තුල ඇතුලත් කර ඇත. මෙම ශේෂය 2011 වසරේ සිට බැංකු ප්‍රකාශන සමග සැසඳීම් කර ඉදිරි මූල්‍ය වාර්තා වල නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(ග) මෙම ශේෂයන් 2004 සිට ගිනුම් වල පැවත එන ශේෂ වන අතර, එම ශේෂ වල සැසඳීම් කටයුතු සිදු කිරීමට මූල්‍ය අංශයේ ප්‍රමාණවත් ලේඛන නොමැත. එමනිසා අදාල ගිණුම් වර්ෂයේ පොළී ආදායම් ලැබීම් නිවැරදිව ගිණුම්ගත කිරීමටත් 2011 සිට ලෙජර ගිණුම් තුල පවතින හඳුනාගත හැකි ශේෂ ඉදිරි මූල්‍ය වාර්තා වල නිවැරදිව බැංකු ප්‍රකාශන සමග සැසඳීම් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ජ) මූල්‍ය අංශයේ පවත්වාගෙන යනු ලබන කුළී ආදායම් ලැබීම් ගිණුම්ට අනුව 2018 වර්ෂය සඳහා මුළු ආදායම රු. 230,716,982.11 වේ. එම වටිනාකම් සකස් වී ඇති ආකාරය **ඇමුණුම 02** ලෙස විගණන අධිකාරියට යොමු කරමි. ඒ අනුව විගණන අංශය වෙත ලබා නොදී ඇති කුලී ඉන්වොයිස් මේ වන විට විගණන අධිකාරිය වෙත ලබා දී ඇත.

(ඩ) 2018 කුලී ආදායමේ රු.9,816,543/- ක වටිනාකම් සඳහා සංස්ථාවේ ඇති ඉන්වොයිස් පත් මේ වන විට විගණන අධිකාරිය වෙත ලබා දී ඇත.

(ට) මෙම ශේෂය 2019 වර්ෂයේ ගිණුම් වල නිවැරදිව ඉදිරිපත් කර තිබේ.

(ත) සතොස විසින් 2014 වර්ෂයේ බට්ටා ලොරිරථ 100 ක් කල්බදු ක්‍රමයට ලබාගෙන තිබේ. එම ව්‍යාපෘතිය නවතා දැමීමට සිදු වූ බැවින් අදාල ලොරිරථ වලින් රථ 99 ක් ලංකා බැංකු කල්බදු සමාගම වෙත මේ වන විට භාර දී තිබේ. තවත් එක් ලොරිරථයක් භාර ඇඳීමට ඇති අතර, එම ලොරිරථය ලබා ගැනීම සඳහා මේ වන විට නීතිමය කටයුතු සිදු කර ඇත. මෙම ලොරිරථය

මහමග දිරාපත් වන බවට ලිඛිත සාක්ෂි නොමැති අතර, එම ලොරිරථය පවරාගත් පුද්ගලයා විසින් කවර අවස්ථාවකදීවත් එම ලොරිරථය භාවිත තත්ත්වයේ නොමැති බවට වාචිකව හෝ ලිඛිතව දන්වා නොමැත. මෙම තත්ත්වය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ සතොස කළමණාකාරිත්වයට එම ලොරිරථය පිළිබඳව ගිණුම් වලට ගැළපීම් කිරීමට නෛතිකව හා ප්‍රායෝගිකව හැකියාවක් නොමැත.

කෙසේ වෙතත් දැනට මෙම පුද්ගලයාට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ලොරිරථයේ වටිනාකම සහ ලොරිරථය වෙනුවෙන් සතොස වෙත ලැබිය යුතු දෛනික ආදායම් වටිනාකම අයකර ගැනීමට කටයුතු කර ඇත. එමනිසා මෙම ලොරිරථය ගිණුම් වලින් කපා හැරීම හෝ ගැළපීම් කිරීම අවශ්‍ය නොවන බව දන්වා සිටිමි.

(ද) මෙහි සඳහන් සහල් කිලෝ ග්‍රෑම් 50 මිටි 7543.51 ගිණුම් වල ගැළපීමේදී මෙම ව්‍යාපෘති අලාභයට කිසිදු බලපෑමක් සිදු වී නොමැත. මෙම ආනයනික සහල් ව්‍යාපෘතියේ සියළු මිළට ගැනීම් නිවැරදිව ගිණුම්ගත කර ඇත. ඒ තුල මෙම සහල් මිටි වල පිරිවැය ද ඇතුලත්ව තිබේ. මෙම තොග මිළට ගැනුම් වලින් අනෑති තොග ඉවත් කර විකුණුම් පිරිවැය ගණනය කර ඇත. මෙහි සඳහන් මිටි 7543.51 ක ප්‍රමාණය සඳහා වන පිරිවැය විකුණුම් පිරිවැය තුල ඇතුලත් වී ඇත.

එමෙන්ම මෙම මිටි ප්‍රමාණය විකුණුම් ලෙස ගිණුම් වල නිරූපණය වී ඇත. එමනිසා මෙම ගැළපීම් මගින් ව්‍යාපෘති අලාභයට කිසිදු බලපෑමක් සිදු වී නොමැත. මෙම මිටි වලට අදාල ආදායම හා පිරිවැය නිවැරදිව නිරූපණය වී තිබේ.

මෙම තොගය තොග හානි ලෙස හඳුනා ගැනීමේදී විකුණුම් පිරිවැයෙන් එම වටිනාකම ඉවත් කර ගැළපීම් සිදු කළ යුතුය. තොග හානි ලෙස හඳුනා ගැනීම සඳහා මේ වනතුරු කිසිදු උපදෙසක් හෝ අනුමැතියක් මූල්‍ය අංශය වෙත ලැබී නොමැත. මෙම දේපළ රාජ්‍ය දේපළ ගණයට වැටෙන බැවින්, ගිණුම් වලින් තොග හානි ලෙස කපා හැරීමට මූල්‍ය අංශයට අධිකාරී බලයක් නොමැත.

විගණන අධිකාරිය විසින් ලබා දී ඇති නිර්දේශය මීළඟ විගණන හා කළමණාකරන කමිටුවේදී සාකච්ඡා කර එම නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නිසි අනුමැතිය ලැබුණු පසු අදාල ගැළපීම් සිදු කිරීමට කටයුතු කරමි.

(න) 2018.12.31 දිනට ගබඩා වල අවසාන තොග සත්‍යාපනය සිදු කරන ලදි. එහිදී ගබඩා වල තිබූ තොග වලින් ප්‍රයෝජනයට ගත නොහැකි සහල් තොග කිලෝ 183,344.10ක ප්‍රමාණයක් තිබූ අතර, එම තොගය 2018 වසරේ තොග පිරිවැයේ ගැනුම් තුල ඇතුලත්ව තිබේ.

මෙම තොග 2019 වසරේදී සත්ත්ව ආහාර ලෙස විකිණීම සිදු කරන ලදි. එම තොගය පිරිවැයට වඩා අඩු මිළට විකුණූ නිසා, පිරිවැය හා විකුණුම් මිළ අතර වෙනස 2018 ගිණුම් වල අවසාන තොග වටිනාකමින් ඉවත් කර දක්වා ඇත. මෙසේ සිදු කළ NRV ගණනය කිරීම සම්බන්ධව තොරතුරු දැනටමත් විගණන අංශය වෙත යොමු කර ඇති අතර, මේ සමග **ඇමුණුම 03** ලෙස නැවත වරක් විගනනයට යොමු කරමි.

මෙම වටිනාකම 2018 වසරේ තොග පිරිවැයේ ගැනුම් තුල ඇතුලත්ව ඇති බැවින් එම තොගය වෙලෙඳ පොළ වටිනාකමට ගලපා වර්ෂයට අදාල තොගයෙන් ඉවත් කර මූල්‍ය ප්‍රකාශණ වල නිවැරදිව නිරූපණය කර ඇත. එම ගැලපීම මගින් පිරිවැය තුල දක්වා ඇති උපලබ්ධි නොවන

වටිනාකම වන රු.6,291,616.33 ආනයනික සහල් ව්‍යාපෘතියේ NRV ගැළපිලි ලෙස ගිණුම් ප්‍රමිත අනුව නිරූපණය කර ඇත.

(බ) 2017 දෙසැම්බර් මස සංස්ථාව විසින් ඉන්දියාවේ සිට ආනයනය කළ සහල් තොග යාත්‍රා දෙක සඳහා පහත පරිදි Stevedoring ගාස්තු ගෙවන ලදි.

AL Mothana	- රු. 14,455,150.00	පොන්නි සම්බා
M.V.Taj	- රු. 8,963,057.46	නාඩු සහල්

මෙම ගාස්තු 2017 වසරේ ආනයනික සහල් ගැණුම් තුල ඇතුලත්ව ඇත. මෙම මුදල සී/ස. ලංකා නැව් සංස්ථාව වෙත ගෙවීම් ඇණවුම් (Pay order) ලෙස ලබාදුන් අතර, ඔවුන් එම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවන ලදි. මේ සඳහා එම සංස්ථාව සතොස වෙත ඉන්වොයිසියක් නිකුත් කරනු ලැබ ඇත. එමනිසා මෙය සෘජු වියදමක් ලෙස සළකා 2017 ගිණුම් වල ගැණුම් පිරිවැයට ඇතුලත් කර ඇත.

නමුත් මෙම මුදලින් පහත සඳහන් මුදල් නැව් සංස්ථාව විසින් සතොස වෙත ගෙවිය යුතු බව අප වෙත දන්වා ඇත.

AL Mothana	- රු. 4,369,861.90
M.V.Taj	- රු. 1,658,492.83

ඒ අනුව සතොස වෙත නැව් සංස්ථාව විසින් රු.6,028,354.73 ක මුදලක් ගෙවීමට ඇත. මේ පිලිබඳව සතොස වෙත එම සංස්ථාව විසින් අදාල තොරතුරු දැණුම් දුන් පසු 2018 වසරේ ගිණුම් වල එම ලැබිය යුතු මුදල වෙනත් ආදායම් ලෙස ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර ඇත.

2017 වසරේ ගිණුම් පිළියෙල කරන අවස්ථාවේ මෙම අය විය යුතු මුදල් පිළිබඳව සතොස වෙත දැණුම් දීම සිදු කරනු ලැබුවේ නම් විගණන අංශය විසින් පවසන පරිදි ආනයනික සහල් ගැණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ හැකිව තිබුණි. නමුත් 2018 ගැණුම් තුල මෙම ගෙවීමට අදාල සහල් වල පිරිවැය නොමැති බැවින් ද සමස්ථ ව්‍යාපෘති ලාභයට / අලාභයට වන බලපෑම ගිණුම් වල නිරූපණය කළ යුතු බැවින් ද මෙම මුදල වෙනත් ආදායම් ලෙස මෙම ව්‍යාපෘතියට ඇතුලත් කර ඇත.

මෙම ගෙවීම් මූල්‍ය ප්‍රකාශණ වල ඉදිරිපත් කිරීම (Presentation) පිළිබඳ දෝෂයක් වන අතර, සමස්ථ ව්‍යාපෘතියේ ලාභයට හෝ අලාභයට මෙම ගණුදෙනුවෙන් සිදු වන බලපෑමක් නොමැති බව දන්වා සිටිමි.

(ප) සතොස විසින් SGS ලංකා ආයතනයෙන් සහල් මිළට ගැනීමක් සිදු කර නොමැත. ඔවුන් මෙම ව්‍යාපෘතියේ ආනයනික සහල් සමීක්ෂණ නියෝජිතයා ලෙස සේවය කළ ආයතනයයි. SGS ඉන්දියන් සමාගම විසින් රු.9,660,965.75 ක වටිනාකමකින් යුතු සහල් තොග මෙරටට ආනයනය කළ බවට සහතික කර තිබුණත්, එම තොග මෙරටට ආනයනය වී නොමැත. ඒ බව SGS ලංකා සමාගම විසින් තහවුරු කර ඇත.

නමුත් එම සහතිකය මත අප විසින් මෙම මුදල අදාල සැපයුම්කරුවන්ට ගෙවූ අතර, එම වටිනාකම ගැණුම් වටිනාකම තුල ඇතුලත්ව ඇත. විගණන අංශය පවසන පරිදි සතොස විසින් රු.9,660,965.75 ක මුදල ගැණුම් වටිනාකමින් ඉවත් කිරීමට නම් අදාල මුදල ලබා ගත් සැපයුම්කරුවන් විසින් එම මුදල් සතොස වෙත ආපසු ගෙවීම සිදු කළ යුතුය. නමුත් එම මුදල ලබාදෙන ලද්දේ සමීක්ෂණ ආයතනය විසිනි.

අප විසින් සැපයුම්කරුවන් වෙත ගෙවීම් සිදු කරනු ලබන්නේ නාවික ලියවිලි සහ ගැණුම් ඉන්වොයිස් අනුවය. එය අප විසින් මහජන බැංකුවේ ආරම්භ කළ ණයවර ලිපි වටිනාකම සමග සමාන වේ. මෙම තොග ගැණුම් තුලින් ඉවත් කිරීමට නම් තොග ආපසු හැරවීමක්, තොග හානියක් ලෙස හඳුනාගත හැකි විය යුතු අතර, මෙම මුදල ලැබුණේ ඒ සඳහා නොවේ.

ගැණුම් වටිනාකම සඳහා විගණනයට ඉදිරිපත් කිරීම සඳහා අදාල සැපයුම්කරුවන්ගේ ගැණුම් ඉන්වොයිස් සහ සතොස විසින් ගෙවන ලද විනිමය ගණුදෙනු ආශ්‍රිත බැංකු ලියවිලි අප සතුව ඇත. එබැවින් ගැණුම් වටිනාකම සඳහා අදාල කිසිදු ගැළපීමක් සිදු කිරීමට නොහැක.

මෙම මුදල SGS සමාගම වෙතින් සතොස වෙත ගෙවන ලද මුදලකි. ඔවුන්ගේ සමීක්ෂණ වාර්තා වල තිබූ වැරදි නොරතුරු නිසා ඔවුන් විසින් මෙම මුදල සතොස වෙත ගෙවා ඇත. මෙය තොග අලෙවියක් ලෙස සෘජුවම සැළකීමට නොහැකි බැවින් එම මුදල වෙනත් ආදායම් ලෙස ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර ඇත.

මේ මගින් ව්‍යාපෘතියේ ලාභය / අලාභය සඳහා සිදුවන බලපෑම ගිණුම් තුලින් නිවැරදිව ගැළපීම් සිදු කර ඇත. මෙය මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම පිළිබඳ දෝෂයක් පමණි.

(ම) 2018.12.31 දිනට හිගුරක්ගොඩ සහ පන්නෙගමුව සතොස වී මෝල් සතුව තිබූ අතුරු නිෂ්පාදන තොග ප්‍රමාණ ඇමුණුම 04 පරිදි වේ. ඒ අනුව පන්නෙගමුව ගබඩාව සතුව කිලෝ 26,208 ක් සහ හිගුරක්ගොඩ ගබඩාව සතුව කිලෝ 22,421 ක් ලෙස මුළු ප්‍රමාණය කිලෝ 48,629 වන අතුරු නිෂ්පාදන තොග ඇතුලත්ව ඇත.

වී සහල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වී මිළට ගැනීමේ පිරිවැයත්, වී සහල් කිරීම සඳහා වන කෙටුම් කුලී පිරිවැයක් තුල මෙම අතුරු නිෂ්පාදන වල පිරිවැය ඇතුලත්ව තිබේ.

මෙම අතුරු නිෂ්පාදන වල එනම්, කැඩුණු සහල්, නිවුඩු, සුණු සහල් වල පිරිවැය වෙන වෙනම ගණනය කිරීමක් සිදු කළ නොහැක. මෙම ව්‍යාපෘතිය වී සහල් කිරීම සඳහා ක්‍රියාත්මක වූ අතර, සුණු සහල්, කැඩුණු සහල් හා නිවුඩු නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රියාත්මක කර නොමැත.

අතුරු නිෂ්පාදන වල පිරිවැය ගිනුම්වල ගැළපීමේදී ඒවායේ තොග වටිනාකම් ගැළපීම් නොකර අතුරු නිෂ්පාදන අලෙවි කිරීමෙන් ලද මුදල් අමතර ආදායම් ලෙස හඳුනා ගැනීම් ගිණුම්කරණ ප්‍රමිත අනුව නිර්දේශ කර ඇත.

එමනිසා මෙම තොග නිවැරදිව ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇති බව ප්‍රකාශ කරමි.

(ය) . i) 2018 වසරේ ගිණුම් පිළියෙල කරන විට සංස්ථාව පරිපාලිත සමාගම් වෙත දන්වන ලද්දේ දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව සමාගම් වල මූල්‍ය වාර්තා ලබා දෙන ලෙසය.

නමුත් ඔවුන් විසින් මාර්තු 31 දිනට ගිණුම් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන බැවින්, ඒකාබද්ධ ගිණුම් සකස් කිරීම සඳහා ඉදිරිපත් කරන මූල්‍ය වාර්තා මූල්‍ය අංශ ප්‍රධානී විසින් සහතික කර සතොස වෙත යොමු කිරීම සිදු කරන ලදි.

කෙසේ වුවද 2019 / 2020 ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට යොමු කරන ලද මූල්‍ය ප්‍රකාශණ වලට එම සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

ii) 2018 වර්ෂය වෙනුවෙන් සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගම විසින් අප වෙත ලබාදුන් මූල්‍ය ප්‍රකාශණය ඇමුණුම - 05 ලෙස විගණන අංශය වෙත ඉදිරිපත් කරමි. ඔවුන් විසින් 2021 වර්ෂයේදී 2017/ 2018 වර්ෂ සඳහා නිවැරදි කරන ලද මූල්‍ය ප්‍රකාශණ සකස් කර 2021.05.20 දින නැවතත් සතොස වෙත ඉදිරිපත් කර ඇත. අප විසින් විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත්තේ 2018 වසර වෙනුවෙන් එම සමාගම විසින් පසුව ඉදිරිපත් කරන ලද එම මූල්‍ය වාර්තා වේ. එම වාර්තාව අනුව අස්පෘෂ්‍ය වත්කම් ශේෂ පත්‍රය තුල වෙන වෙනම නිරූපණය කළ ද සතොස විසින් 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ සකස් කරන විට එම ආයතනය විසින් සතොස වෙත ඉදිරිපත් කළ මූල්‍ය වාර්තා අනුව මෙම අස්පෘෂ්‍ය වත්කම් දේපළ පිරියත හා උපකරණ වල ඇතුලත් කර තිබිණි.

2019 වසරේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී සතොස ඉදි කිරීම් හා ඉංජිනේරු සමාගම විසින් නිවැරදි කර ඉදිරිපත් කළ 2017, 2018 වර්ෂ වලට අදාල මූල්‍ය ප්‍රකාශණ වල ගැළපීම් ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට යොදාගෙන නිවැරදිව මූල්‍ය ප්‍රකාශණ වල දන්වා ඇත.

iii) සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා සමාගම වෙතින් සංස්ථාව වෙත 2018 වර්ෂය තුල ලබා දී ඇති ආරක්ෂක ගාස්තු පහත පරිදි වේ.

2018 වර්ෂය සඳහා ආරක්ෂක ගාස්තු	රු. 21,787,902.88
15% වැට් බදු	රු. 3,263,542.33
මුළු ඉන්වොයිස් අගය	රු. 25,051,445.21

ඉහත සමාගම විසින් සතොස වෙත යොමු කළ ආරක්ෂක ගාස්තු වලට අදාල ඉන්වොයිස් පත් වලට අනුව අප විසින් ලෙජර් ගිණුම් වලට අවශ්‍ය තොරතුරු ඇතුලත් කර ඇත.

සමූහයේ ආරක්ෂක වියදම් සෘණ අගයක් ගෙන ඇත්තේ වැට් මුදල් සහිත ආරක්ෂක වියදම්, ආරක්ෂක වියදම් තුලින් ඉවත් කිරීම නිසාය. එම සෘණ අගය ආරක්ෂක ගාස්තු වල වැට් අගයයි. 2019 වසරේ ගිණුම් වල 2018 වසර නිරූපණය කරන සටහන් තුලින් මෙම ඉදිරිපත් කිරීමේ දෝෂය නිවැරදි කිරීමට පියවර ගනිමි.

iv) අප විසින් විගණන අංශය වෙත යොමු කර ඇත්තේ 2021.05.20. දින සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගම විසින් නිවැරදි කර පසුව ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශණ වන අතර, 2018 ඒකාබද්ධ ගිණුම් සකස් කිරීම සඳහා අප විසින් යොදා ගනු ලැබූ එම ආයතනය විසින් අප වෙත යොමු කළ ගිණුම් වාර්තා **ඇමුණුම - 05** ලෙස විගණනයට ඉදිරිපත් කරමි. එම ගිණුම් වාර්තා අනුව වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ වල එකතුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ වල නිරූපණය කර ඇති ශේෂය සමග එකඟ වේ.

v) **ඇමුණුම - 05** ලෙස අප විසින් මේ සමග යොමු කරන සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගම විසින් අප වෙත යොමු කළ මූල්‍ය ප්‍රකාශණ අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ වල දන්වා ඇති පරිපාලන වියදම් වල එකතුව නිවැරදි වේ.

(ර) මෙම ශේෂ දිගුකාලීනව ලෙජර් ගිණුම් තුල නිරූපණය වන ශේෂ වේ. මේවා පරීක්ෂා කර අදාල ගැළපිලි ඉදිරි මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී සිදු කිරීමට කටයුතු කරමි.

2.2.4. <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

(i) **<u>නඩුවකින් ලැබිය යුතු ශේෂය - රු.25,900,236/-</u>**

මෙම වටිනාකමට ඇතුලත් කර ඇති සහල් පිළිබඳ තොරතුරු ඔරුගොඩවත්ත 3, 6, 9 ගබඩා වලට භාරදුන් තොග ලැබීම් පත් (SR) වල ඇතුලත්ව ඇත. දැනට මෙම පත්‍රිකා වල මුල් පිටපත් අපරාධ පරීක්ෂණ දෙපාරතමේන්තුවේ අදාල පරීක්ෂණ කටයුතු සඳහා භාර දී ඇත. මූල්‍ය අංශයේ එම පත්‍රිකා වල පිටපත් ඇත. මේවා විගණන අධිකාරිය වෙත විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධව සංස්ථාවේ අභ්‍යන්තර විගණක විසින් පරීක්ෂණ කටයුතු සිදු කර එහි වාර්තාව සාමාන්‍යාධිකාරී වෙත භාර දී ඇත. ඒ අනුව ඔහු විසින් එම වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශණ කටයුතු සඳහා ලබාදී ඇත. නඩු අංක B - 29743 යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධව පරීක්ෂණ කටයුතු සිදුකරයි.

එම තොග වලට අයත් සහල් වර්ගය අනුව අදාල පිරිවැය ගණනය කිරීම් පිළිබඳව ඇති වාර්තාව **ඇමුණුම - 06** ලෙස විගණනයට යොමු කරමි. මෙම ගණනය කිරීම් සඳහා යොදා ගෙන ඇත්තේ අදාල සහල් ආනයනය සඳහා වැය කළ මුළු මුදල වන අතර, මේ සම්බන්ධ සියළු තොරතුරු විගණන අංශය විසින් දැනටමත් පරීක්ෂා කර ඇති බව කාරුණිකව දන්වමි. මීට අමතරව තවදුරටත් පැහැදිලි කිරීම් හෝ විගනණ සාක්ෂි ලබාදීමට හැකිබව දන්වා සිටිමි.

(ii) <u>භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂ</u>

- **ණය පියවීම - රු.98,718,402/-**

අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මහජන බැංකුව වෙතින් 2006 වසර වන විට ලබාගෙන තිබූ ණය මුදල රු.207,097,943/- කි. 2008 දී එම ණය මුදල රු.207,050,943/- ක් වූ අතර, 2017 වසරේ සහල් ආනයනය කිරීම සඳහා මහජන බැංකුවෙන් ණය සහනාධාර (Letter of Comfort) ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීමේදී බැංකුව විසින් එම ණය මුදලින් රු.98,718,401.75 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙතින් පියවාගෙන ඇති බව ප්‍රකාශ කරන ලදි. ඔවුන් සංස්ථාව විසින් ගෙවිය යුතු ණය මුදල තහවුරු කර ලිපියක් යොමු කර ඇති අතර, ඒ අනුව මෙම ගැළපීම් 2016 වසරේදී සිදු කර ඇත.

එම ණය මුදල සතොස විසින් මහජන බැංකුව වෙත ගෙවිය යුතු ණයක් වන අතර, එය මහා භාණ්ඩාගාරය විසින් ගෙවීම් කර ඇති බැවින් එම මුදල සතොස විසින් මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු බැවින් මෙම ගැලපීම සිදු කර ඇත. ණය ශේෂය තහවුරු කර බැංකුව විසින් යොමුකල ලිපිය ඇමුණුම - **07** ලෙස මෙයට යා කර ඇත.

- **ණය ප්‍රතිව්‍යුහගත කිරීම - රු.275,000,000.00**

වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමට 2006 වසරේ මහ භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති රු.275,000,000/- ක ණය මුදල 2008 වසරේ සිට ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිත යටතේ භාරකාර කුවිතාන්සි ණය (TR Loan) - මහජන බැංකුව ලෙස ගිණුම්ගත කර තිබුණි.

2016 වසරේ විගණකාධිපති වාර්තාවේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ මෙම මුදල ආපසු ගෙවිය යුතු ණය ලෙස ගිණුම්ගත කරන මෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව අප විසින් 2017 ගිණුම් ඉදිරිපත් කිරීමේදී 2016 ගිණුම නිවැරදිව නැවත සකස් කර විගණනයට යොමු කර තිබේ. 2006 වසරේ සිදු වූ මෙම ගණුදෙනු වලට සම්බන්ධ වටිනාකම තහවුරු කිරීමේ ලේඛන සතොස මූල්‍ය අංශයේ නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

- **SRL**
  - **ණයහිමියෝ - රු. 655,000,000.00**
  - **බැංකු වගකීම් - රු. 225,000,000.00**
  - **ලද විකුණුම් - රු. 680,000,000.00**

2003 වසරේ සතොස සිල්ලර සමාගම ඇවර කරන ලද අතර, මෙම ශේෂයන් 2003 වසරේ සිට මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කිරීම් සිදු කරනු ලබයි.

දැනට වසර 18 කට පෙර සිදු වූ මෙම ගණුදෙනු පිළිබඳ වටිනාකම තහවුරු කිරීමට ලේඛන කිසිවක් මූල්‍ය අංශයේ නොමැති බව දන්වා සිටිමි.

(iii) <u>දිගුකාලීන නිග හිටි වෙළඳ ණයගැති ශේෂය - රු.6,214,481/-</u>

මෙම ශේෂය සකස් වී ඇත්තේ දිගුකාලීන ණයගැති ශේෂයන් 14 ක එකතුවෙනි (**ඇමුණුම 08**) . මෙම එක් එක් ලෙජර් ගිණුම් 2011 ට පෙර සිට පැවත එන අතර, එම ලේඛණ ඒ ඒ වර්ෂ වල විගණන අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. 2011 ට පෙර වර්ෂ වලට අදාල ලේඛන දැනට මූල්‍ය අංශය තුල නොමැත.

SZECHUAN HOUSE ආයතනය වෙතින් මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරගෙන යනු ලබයි. 2011 වසරේ සිට ගණුදෙනු ආරම්භ කර ඇති ශේෂ පිළිබඳව තව දුරටත් විමර්ශනය කර සැසඳීම් කර මූල්‍ය අංශයේ ගබඩා තුල එම ලේඛණ තිබේදැයි පරීක්ෂාකර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. මෙම ශේෂ වසර ගණනාවකට පෙර සිට පැවත එන ශේෂ වන බැවින් ඒවා පරීක්ෂා කිරීමට යම් කාලසීමාවක් ගතවන බවත් එමනිසා ඉදිරි මූල්‍ය ප්‍රකාශණ වල සුදුසු පරිදි කටයුතු කිරීමට පියවර ගනිමි.

(iv) <u>දිගුකාලීන නිග හිටි වෙළඳ ණයගැති ශේෂය - හාණිකරණය - රු.6,214,481/-</u>

හාණිකරන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම ශේෂ ඉදිරිපත් කර තිබේදැයි පරීක්ෂා කර බලා අදාල අංශ වෙතින් විමසා ඒ සඳහා අනුමැතිය ලබාගෙන තිබේ නම් විගණන අංශයට යොමු කිරීමට කටයුතු කරමි.

(v) <u>දිගුකාලීන නිග හිටි වෙනත් ණයගැතියෝ - රු.170,370,348/-</u>

මෙම ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් ශේෂ සහ කාල විශ්ලේෂණයන් පිළිබඳ තොරතුරු **ඇමුණුම 09** ලෙස මේ සමග විගණනයට යොමු කරමි. මෙම ශේෂයන් ගිණුම් වල දැක්වෙන්නේ 2011 ට පෙර සිට වන අතර, අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ ප්මණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරීක්ෂා කිරීමට හැකියාවක් නොමැත.

2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම් වල පවතින බැවින්, ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. එම ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින්, ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා හාණිකරන සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

මෙම ශේෂය තුල ඇතුලත් 2011 වසරෙන් පසුව ගණුදෙනු සිදුවූ ශේෂ පිළිබඳව ඉදිරියේදී තව දුරටත් විමර්ශනය කර සැසඳීම් කර මූල්‍ය අංශයේ ගබඩා තුල එම ලේඛණ තිබේදැයි පරීක්ෂාකර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. මෙම ශේෂ වසර ගණනාවකට පෙර සිට පැවත එන ශේෂ වන බැවින් ඒවා පරීක්ෂා කිරීමට යම් කාලසීමාවක් ගතවන බවත් එමනිසා ඉදිරි මූල්‍ය ප්‍රකාශණ වල සුදුසු පරිදි කටයුතු කිරීමට පියවර ගනිමි.

(vi) <u>දිගුකාලීන හිඟ හිටි වෙනත් ණයගැති ශේෂය - හාණිකරණය - රු.170,370,348/-</u>

මේ සම්බන්ධව ලබා ඇති අනුමැතිය පිළිබඳ අදාල අංශ වෙතින් විමසා එම අනුමැතිය ලබාගෙන තිබේ නම් විගණන අංහය වෙත යොමු කරමි.

(vii) <u>වෙනත් ණයගැතියෝ - ගමට සවිය ව්‍යාපෘතිය - රු.42,568,994/-</u>

මෙම ශේෂය සකස් වී ඇත්තේ ඇමුණුම **10** සඳහන් ගිණුම් ශේෂ එකතු වීමෙනි. මෙම ව්‍යාපෘතිය 2014/2015 කාල සීමාව තුල සිදු කර ඇත. මේ සම්බන්ධ ඉන්වොයිස් සහ ලදුපත් එම වර්ෂ වල විගණනයට යොමුකර ඇත.

එම ලේඛණ මූල්‍ය අංශයේ ගබඩා තුල තිබෙදැයි පරීක්ෂාකර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. මෙම ශේෂ වසර ගණනාවකට පෙර සිට පැවත එන ශේෂ වන බැවින් ඒවා පරීක්ෂා කිරීමට යම් කාලසීමාවක් ගතවන බවත් එමනිසා ඉදිරි මූල්‍ය ප්‍රකාශණ වල සුදුසු පරිදි කටයුතු කිරීමට පියවර ගනිමි.

(viii) <u>දිගුකාලීන හිඟ හිටි කුලී ණයගැතියෝ - රු.88,071,071/-</u>

මෙම ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් ශේෂ සහ කාල විශ්ලේෂණයන් පිළිබඳ තොරතුරු ඇමුණුම **11** ලෙස මේ සමග විගණනයට යොමු කරමි. මෙම ශේෂයන් ගිණුම් වල දැක්වෙන්නේ 2011 ට පෙර සිට වන අතර, අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරීක්ෂා කිරීමට හැකියාවක් නොමැත.

2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම් වල පවතින බැවින්, ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. එම ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින්, ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා හාණිකරන සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

මෙම ශේෂය තුල ඇතුලත් 2011 වසරෙන් පසුව ගණුදෙනු සිදුවූ ශේෂ පිළිබඳව ඉදිරියේදී තව දුරටත් විමර්ශනය කර සැසදීම් කර මූල්‍ය අංශයේ ගබඩා තුල එම ලේඛණ තිබෙදැයි පරීක්ෂාකර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. මෙම ශේෂ වසර ගණනාවකට පෙර සිට පැවත එන ශේෂ වන බැවින් ඒවා පරීක්ෂා කිරීමට යම් කාලසීමාවක් ගතවන බවත් එමනිසා ඉදිරි මූල්‍ය ප්‍රකාශණ වල සුදුසු පරිදි කටයුතු කිරීමට පියවර ගනිමි.

(ix) <u>සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂය - සී/ස.සතොස රිටේල් සමාගම - රු.110,878,720/-</u>

ඉහත ආයතනය 2003 වසරේ සිට ඇවර කර ඇති අතර, මේ සම්බන්ධව රු.42,623,064.07 ක මුදලක් පමණක් 2013 වසරේදී සතොස වෙත ලැබී ඇත. ඉතිරි මුදල වන රු.110,878,720/- අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින්, ඒ සම්බන්ධව හාණි කරන වෙන් කිරීම් අදාල ගිණුම් ප්‍රමිත අනුව සිදු කර ඇත. 2003 වසර හා ඊට පෙර වර්ෂ වල සිදු වූ

ගණුදෙනු සම්බන්ධ ලිපි ලේඛන මේ වන විට සතොස මූල්‍ය අංශය සතුව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

එමනිසා විගණන අධිකාරිය විසින් ඉල්ලා සිටින ලැබිය යුතු ශේෂ සම්බන්ධ ලිපි ලේඛන කිසිවක් සංස්ථාව සතුව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. මේ අගය පිළිබඳව ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරමි.

(x) <u>දිගුකාලීන නිග හිටි වෙළඳ ණයහිමි ශේෂය - රු.3,519,166/-</u>

මෙම ශේෂය සකස් වී ඇති ආකාරයත් කාල විශ්ලේෂණයත් ඇමුණුම **12** ලෙස විගණනයට ඉදිරිපත් කරමි. මෙම ශේෂ සඳහා අදාල ඉන්වොයිස් මූල්‍ය අංශයේ ගබඩා වල තිබේදැයි පරීක්ෂා කර බලා මේ සමග විගණනයට යොමු කරමි.

(xi) <u>දිගුකාලීන නිග හිටි වෙනත් ණයහිමි ශේෂය - රු.187,678,063/-</u>

මෙම ශේෂය සකස් වී ඇත්තේ ඇමුණුම **13** සඳහන් ගිණුම් ශේෂ එකතු වීමෙනි. මෙම ශේෂයන් 2011 වසරට පෙර සිට මූල්‍ය ප්‍රකාශණ වල නිරූපණය වේ. මේ සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින්, මෙම ශේෂ කපා හැරීමේ කමිටුවට ඉදිරිපත් කර ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(xii) <u>ගෙවිය යුතු එකතු කළ අගය මත බදු - රු.150,812,239/-</u>

මෙම ශේෂය සකස් වී ඇත්තේ ඇමුණුම **-14** සඳහන් ගිණුම් ශේෂ එකතු වීමෙනි. සතොස විසින් 1995 සිට ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත බදු ගෙවීම් කර නොමැති බව ඔවුන් විසින් අප වෙත එවා ඇති ලේඛන අනුව පැහැදිලිය. ඒ අනුව අප විසින් ඒ ඒ වර්ෂයට අදාල බදු පිළිබඳව ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කරන ලදි. ඉන් අනතුරුව 2017 වසරේ සිට 2021 වසර වන විට 1995-2016 කාලසීමාවට අදාල එකතු කළ අගය මත බදු ලෙස රු.126,106,615.90 ක මුදලක් පහත පරිදි ගෙවා ඇත.

- 1995 – 2009 : - රු. 103,987,435.26
- 2010 – 2015 :- රු. 8,373,619.93
- 2016 : - රු. 13,745,560.67

2017/2018 වසරේ ආනයනික සහල් ව්‍යාපෘතියේ එකතු කළ ආදායම් මත බදු ලෙස ගෙවූ යෙදවුම් බදු (Input Tax) ප්‍රමාණය වැඩි බැවින් සතොසට එකතු කළ අගය මත බදු ගෙවීමට නොමැත. 2019 වසරේ ගණනය කළ බදු මුදල එම වසරේ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ගිණුමේ නිවැරදිව සඳහන් කර ඇත. 2020 වසරේ සිට සතොස ආයතනය ඉහත බද්දෙන් නිදහස් කර ඇති අතර, අද වන විට අප විසින් මෙම බදු ගෙවීම සිදු නොකරන බව දන්වා සිටිමි. 2019 වසරේදී ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ගිණුම් නිවැරදිව ගැළපිලි කර මූල්‍ය ප්‍රකාශණ වල දක්වා ඇත. බදු මුදල් ගණනය කිරීමට අදාල ලිපිගොනුව මේ සමග විගණනයට යොමු කරමි.

(xiii) <u>ගෙවිය යුතු වර්තමාන බදු - රු.161,833,614/-</u>

මෙම ශේෂය සකස් වී ඇත්තේ ඇමුණුම -14 සඳහන් ගිණුම් ශේෂ එකතු වීමෙනි. මේ යටතේ සඳහන් කර තිබෙන ආදායම් බදු ගෙවීම 2013/2014 සිට 2016/2017 දක්වා රු.7,389,359/- වේ. මෙම වර්ෂ හතරට අදාල ගණනය කිරීම් පහත දක්වා ඇත.

2013/2014	රු.2,474,109.00
2014/2015	රු.2,860,143.00
2015/2016	රු.1,215,276.00
2016/2017	රු. 839,831.00
	රු.7,389,359.00

මෙම මුදල 2021.08.02 දින ගෙවීම් කර ඇත. මේ සම්බන්ධ ආදායම් බදු ප්‍රකාශණ ලිපිගොනුව මේ සමග විගණනයට යොමු කරමි.

2017/2018 සහ 2018/2019 බදු වර්ෂ වල සතොස දරා ඇති අලාභය නිසා එම වර්ෂ වලට ආදායම් බදු වගකීමක් නොමැත. මෙම ගිණුම් නිවැරදි කර 2019 ගිණුම් වර්ෂයේ මූල්‍ය වාර්තා නිවැරදිව සකස් කර තිබේ.

මීට අමතරව 1995/2009 කාලසීමාවට අදාලව ඇමුණුම - 15 සඳහන් පරිදි අනෙකුත් බදු ගෙවීම් කිරීමට ඇති බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව අප වෙත දන්වා එවා ඇත.එම ගෙවිය යුතු බදු මුදල රු.126,776,795/- කි. ඒ මත පනවා ඇති බදු මුදල රු.98,945,707/- කි. ඒ අනුව ගෙවිය යුතු මුළු මුදල රු.225,722,502/- කි. ඉහත බදු මුදල් වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට 1995-2009 වසරට අදාල බදු ප්‍රකාශණය මූල්‍ය අංශයේ නොමැත. නමුත් මෙම මුදල් ගෙවීමට ආයතනයට හැකියාවක් නොමැති බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත අප විසින් දැණුම් දී ඇත.

(xiv) <u>තැන්පතු සහ අත්තිකාරම්</u>

- **වර්තමාන ශේෂ - රු.15,885,549/-**

මෙම ශේෂය සකස් වී ඇත්තේ පහත පරිදි වේ.

- **කුලී තැන්පතු - රු.1,000,000/-**
  'Anwer Hardware වෙත 2016 වසරේදී සතොස විසින් ලබා දුන් තැන්පතු මුදල් වේ. 2016.04.06 දින 707613 දරණ චෙක්පත මගින් PM16/706/00063 වවුචරය යටතේ මෙම මුදල ලබා දී ඇත. මේ සම්බන්ධ මූලාශ්‍ර ලේඛන 2016 දී විගණන අංශය වෙත යොමු කර ඇත. අවශ්‍ය නම් නැවත ලබා දිය හැක.

- **අත්තිකාරම් - රු.130,980/-**
- **අත්තිකාරම් (වෙනත්) - රු.32,000/-**

මෙම මුදල් ආයතනයේ දෛනික අළුත්වැඩියා, හදිසි මිළට ගැණුම්, ගමන් වියදම් සඳහා අංශ ප්‍රධානි නිර්දේශ මත සාමාන්‍යාධිකාරි අනුමැතිය මත සේවකයින් වෙත ලබා දෙන අත්තිකාරම් මුදල් වේ. ඒ ඒ වර්ෂ වල විගණන කටයුතු සඳහා සියළුම ගෙවීම් වවුවර ඉදිරිපත් කරන බැවින්, මෙම ගෙවීම් විගණන අධිකාරිය වෙත මින් පෙර ලබා දී ඇත. 2018 වසරේ විගණන කටයුතු සඳහා මෙම මුදල් ලබා දී ඇති වවුවර් පත් සියල්ල යොමු කර ඇත.

- **නැවත ලබා ගත හැකි කැන්පතු (ඉන්ධන) - රු.1,750,000/-**

සතොස ප්‍රවාහන අංශයේ ලොර් රථ සඳහා ඉන්ධන ලබා දීම සඳහා තෝරාගත් ආයතන වෙත සතොස විසින් තබා ඇති කැන්පතු මුදල් වේ. මෙම ශේෂය පහත පරිදි සැකසී ඇත.

2014.01.01 දින වවුවර් අංක PM14/707/0001 යටතේ චෙක්පත් අංක 636208 මගින් රු.1,500,000/-ක මුදලක් C.F. De Mel & Sons (Pvt) Ltd වෙත ගෙවා ඇත.

2016.06.08 දින වවුවර් අංක PM16/706/00260 යටතේ චෙක්පත් අංක 707835 මගින් රු.250,000/-ක මුදලක් කුරුණෑගල Nelson Auto Services වෙත ගෙවා ඇත.

- **නැවත ලබා ගත හැකි බහලුම් කැන්පතු - රු.12,857,569/-**

2017/2018 වසරේ සහල් ආනයනය කළ බහලුම් සඳහා නැව් සමාගම් වෙත සතොස විසින් ගෙවා ඇති නැවත ලබා ගතහැකි බහලුම් තැම්පතු මුදල් මේ ශෙෂය තුල ඇතුලත් වේ. අදාල බහලුමේ තොග ගබඩා වෙත ගෙන ගොස් එම බහලුම නැව් සමාගමේ බහලුම් ගබඩාව වෙත භාරදුන් පසු ඔවුන් ලබාදෙන වාර්තාව නැව් සමාගම වෙත ඉදිරිපත් කළ පසු අප විසින් තබා ඇති කැන්පතු මුදල නැව් සමාගම විසින් සතොස වෙත නැවත ගෙවනු ලබයි. මෙලෙස තබා ඇති කැන්පතු පිළිබඳ තොරතුරු ඇතුලත් ලිපි ගොනුව 2021.10.05 දින විගණන අංශය වෙත යොමු කර ඇත.

- **කුලී කැන්පතු - රු.115,000/-**

මෙම ශේෂය සකස් වී ඇත්තේ පහත පරිදි ය.

- යාපනය / කිලිනොච්චි ගොඩනැගිලි කුලී රු.10,000/- (වවුවර් අංක PM17/709/0157 යටතේ 2017/07/03 දින චෙක්පත් අංක 577022 යටතේගෙවා ඇත.)
- යාපනය ගොඩනැගිලි කුලී රු.10,000/- (වවුවර් අංක PM17/709/0160 යටතේ 2017/07/03 දින චෙක්පත් අංක 577025 යටතේ ගෙවා ඇත.)
- 2017.07.07 දින 2017/0025 අත්තිකාරම් මුදලින් රු.5,000/- ක කුලී අත්තිකාරම් ගෙවා ඇත.

- දිගුකාලීන ශේෂය - රු.29,692,440/-)

මෙම ශේෂය ඇමුණුම - 16 සඳහන් ගිණුම් ශේෂ එකතු වීමෙන් සකස් වී ඇත. මෙම ශේෂයන් ගිණුම් වල දැක්වෙන්නේ 2011 ට පෙර සිට වන අතර, අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරීක්ෂා කිරීමට හැකියාවක් නොමැත.

2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම් වල පවත්නා බැවින්, ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. එම ශේෂයන් සත්‍යාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින්, ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා හානිකරන සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

xv. **ලැබිය යුතු පොළී ගිණුම - රු.3,851,521/-**
මෙම ගිණුම 2013 වසරේ සිට ලෙජර් ගිණුම් වල දක්වා ඇත. මෙහි සඳහන්ව ඇත්තේ 2015 වසරේ සිට පැවත එන ශේෂයකි.
එම ශේෂය සැසඳීම් කිරීමට 2013 වසරේ සිට ලෙජර් ගිණුම් පරීක්ෂා කළ යුතු බැවින්, එම ශේෂය එලෙසම ගිණුම් වල දක්වා ඇත. ඉදිරියේදී එම ශේෂය සැසඳුම් කර ගිණුම් වල නිවැරදි කිරීම් සිදු කරමි.

xvi. **මුදල් හා මුදල් සමාන දෑ තුල ඇතුලත් අකැකි මුදල් ශේෂය - රු.3,129,264/-**

2015 වසරේ මුදල් පොත පරීශීලනය කිරීමට අවශ්‍ය පහසුකම් විගණන අංශයට සළසා දී ඇත. එමගින් මුදල් පොතේ ගණුදෙනු පරීක්ෂා කිරීමට හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

xvii. **ස්ථාවර තැන්පතු ශේෂය - රු.5,882,416/-**

මෙම තොරතුරු විගණන විමසුම් අංක TCM/C/CWE/2/2018/AQ/1 පිළිතුර සමග විගණන අංශයට යොමු කර ඇත.

xviii. ඉහත ආයතනය 2003 වසරේ සිට ඇවර කර ඇත. 2003 වසර හා ඊට පෙර වර්ෂ වල සිදු වූ ගණුදෙනු සම්බන්ධ ලිපි ලේඛන මේ වන විට සතොස මූල්‍ය අංශය සතුව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

එමනිසා විගණන අධිකාරිය විසින් ඉල්ලා සිටින ලැබිය යුතු ශේෂ සම්බන්ධ ලිපි ලේඛන කිසිවක් සංස්ථාව සතුව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. මේ අගය පිළිබඳව ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරමි.

සමාලෝචිත වර්ෂයට අයත් සියළු තොරතුරු විගණන අධිකාරිය වෙත යොමු කර ඇත. මෙහි දක්වා ඇති දිගුකාලීන ණයගැති / ණයහිමි ශේෂ 2011 වසරට පෙර පවතින ශේෂ බැවින්, ගිණුම් පරීක්ෂා කිරීමට එම කාලසීමාව සඳහා ලෙජර් ගිණුම් හා මූලාශ්‍ර ලේඛන නොමැත. ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරමි.

2.2.5. <u>නොඉසුදුනු පාලන ගිණුම්</u>

(අ) 2017 වසරේ මූල්‍ය ප්‍රකාශණ සිළියෙල කරන විට මූල්‍ය අංශය වෙත ලබා දුන් ලියවිලි අනුව ශේෂය රු.71,984,473/-ක් විය. 2019 වසරේ ගිණුම් සකස් කිරීමේදී මෙම ශේෂය රු.79,915,868.73 ක් වූ අතර, ඒ අනුව අදාල වෙන් කිරීම් නිවැරදිව ගිණුම්ගත කර 2019 වසරේ ගිණුම් වල දක්වා ඇත. මෙම වගකීම් සකස් වී ඇත්තේ පහත පරිදි ය.

2016	රු. 61,629,620.79
2017	රු. 10,354,852.00
2018	රු. 7,679,354.74
2019	රු. 252,041.20

ඉහත ශේෂය සනාථ කරන ලද ලිපිය ඇමුණුම් - 17 ලෙස ඉදිරිපත් කරමි.

(ආ) මෙම වෙනසට හේතුව ඇමුණුම් - 18 හි දක්වා ඇත. 2019 වර්ෂය තුල බැංකු ප්‍රකාශණ වල දක්වා ඇති 2018 වර්ෂය සඳහා පොළී ගෙවීම් වෙනුවෙන් 2018 මූල්‍ය ප්‍රකාශණ මගින් වෙන් කළ මුදල රු.40,412,162/- කි. එම මුදල වෙනුවෙන් අප විසින් ගෙවිය යුතු පොළී මුදල් වෙන් කිරීම් සිදු කරන ලදි. නමුත් බැංකුව විසින් 2021.02.18 දින අප වෙත ගෙවිය යුතු පොළී සනාථන සහතික යොමු කර ඇත. ඒ අනුව රු.10,178,807/- ක මුදලක වෙනසක් නිරීක්ෂණය විය. 2019.08.01 දින බැංකුව වෙත ගෙවීමට තිබූ ණය මුදල රු.5,453,101,924/- ක් වූ අතර, ඒ දක්වා ගෙවිය යුතු උපචිත පොළිය සහ දඩ මුදල රු.312,080,049.20 ක් විය. මෙම පොළී මුදල තුල 2018 වසරේ නොගෙවූ පොළිය වන රු.10,178,807/- ක අගය ඇතුලත් වී ඇත. මෙම උපචිත පොළිය සහ දඩ මුදල 2019.08.01 දින සිට ගෙවිය යුතු ණය මුදලට එකතු කර එක්කාලීන ණය මුදලක් ලෙස බැංකුව විසින් නැවත ඇස්තමේන්තු කර ඇත. එමනිසා ගෙවිය යුතු ණය මුදල රු.5,765,181,973/- ක් ලෙස ගිණුම්ගත කර ඇත.

2018 වසරේ උපචිත ණය පොළිය 2018 වසරේ ලාභාලාභ ගිණුමෙන් ගළපා ඉවත් කළහොත්, එම මුදල නැවත ණය මුදලට එකතු කිරීම සිදු කළ නොහැකි බැවින් 2019 වසරේ ගෙවන ලද ණය පොළිය පමණක් ලාභාලාභ ගිණුමෙන් ලාභයට ගළපා 2018 වසර සඳහා තව දුරටත් ගෙවිය යුතු රු.10,178,807/- ක අගය 2019 වසරේ ගෙවිය යුතු ණය මුදලට එකතු කර ඇත. මේ සම්බන්ධ වැඩිමනත් තහවුරු කිරීම් අවශ්‍ය නම් ඉදිරිපත් කිරීමට හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) මෙම ශේෂ තුල නියමිත කාලයට ගවිය යුතු ණය පොළිය නොගෙවීම් මත බැංකුව විසින් අය කළ දඩ පොළී මුදල ඇතුලත් කර ඇත. තවද ඒ ඒ ණය මුදල සඳහා ගණනය කළ දඩ පොළී මුදල් ගණනය කිරීමට අපහසු බැවින්, මෙලෙස එක් ණය පොලියක් යටතේ අදාල දඩ මුදල් එකවර අය කර ඇත. එමනිසා මෙහි දක්වා ඇති ණය අංක යටතේ මූල්‍ය ප්‍රකාශණ වල දක්වා ඇති ශේෂ බැංකු තහවුරු ලිපියේ ශේෂ සමග වෙනස් වේ.

(ඇ) 2018 වසරේ චින්මාළු සඳහා සහනාධාර ලෙස සතොස වෙත ලැබුණු මුදල රු.53,835,840/= ක් වේ. එම අගය සකස් වී ඇති ලදුපත් අංක සහ මහ භාණ්ඩාගාරයෙන් ලැබුණු චෙක්පත් අංක සහ එහි වටිනාකම් පහත පරිදි වේ.

දිනය	ලදුපත් අංකය	චෙක්පත් අංකය	මුදල
2018.01.30	CWE 100/18/0056 (No -10914)	059640 (මෙම චෙක්පත කොමර්ෂල් බැංකුවේ 706 ගිණුමේ තැන්පත් කර ඇත.)	රු. 21,124,800.00
2018.05.09	CWE 100/18/0274 (No – 012079 / 012080)	063501 063502 (මෙම චෙක්පත් කොමර්ෂල් බැංකුවේ 706 ගිණුමේ තැන්පත් කර ඇත.)	රු. 15,592,320.00
2018.12.26	CWE 100/18/0760 (No – 013305)	077139 (මෙම චෙක්පත සම්පත් බැංකු ගිණුමේ තැන්පත් කර ඇත.)	රු. 17,118,720.00

මෙම ලදුපත් වල මුළු එකතුව රු.53,835,840/- කි. මෙම අගයට අදාල ලදුපත් 04 සමග ලෙජර ගිණුමද විගණනයට යොමු කරමි **(ඇමුණුම - 19)**. 2018 වසරේ මූල්‍ය ප්‍රකාශණ වල මෙම ශේෂය නිවැරදිව ගිණුම්ගත කර ඇත.

2.2.6 මතභේදාත්මක ගණුදෙනු

(අ) මෙම ගිණුම් ශේෂ 2011 වසරේ සිට 2015 වසර වනතෙක් පැවති ගිනුම් ශේෂ වන අතර, මෙම ශේෂ සැසඳීම් කිරීමෙන් අනතුරුව වාර්තාවක් ලබා දෙමි.

(ආ) මෙම ව්‍යාපෘතියට අදාල සාමාන්‍ය අපතය ගණනය කිරීමේ නිරවද්‍යතාවය තහවුරු කිරීමට අවශ්‍ය ගණනය කිරීම් විගණන අංශයට යොමු කර තිබේ.

සහල් භාරදුන් වී මෝල් විශාල ප්‍රමාණයක් 2018 වසරේදී සිය ගිණුම් පියවීමට කටයුතු කළ බැවින්, 2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී මෙම වටිනාකම වැඩිපුර දැක්වීමට හේතු වූ බව දන්වා සිටිමි. මේ සම්බන්ධව සියළු තොරතුරු 2018 වසරේ වියදම් වවුචර් වල කෙටුම් කුලී ගෙවීම් පරීක්ෂා කිරීමේදී ලබාගත හැකි බවත්, එම සියළු වවුචර් විගණන අංශයට යොමු කළ බවත් කාරුණිකව දන්වා සිටිමි.

3. මූල්‍ය සමාලෝචනය

3.1. මූල්‍ය ප්‍රතිඵල

2017/2018 ආනයනික සහල් ව්‍යාපෘතිය රජයේ අවශ්‍යතාවය මත සංස්ථාව විසින් සිදු කරන ලද අතර, එම ව්‍යාපෘතියේදී සහල් පිරිවැයට වඩා අඩු මුදලකට විකිණීමට සංස්ථාව වෙත උපදෙස් දී තිබුණි. ඒ අනුව අමප /18 /0572 /752 /003 - iii දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙම ව්‍යාපෘතියේ අලාභය මහ භාණ්ඩාගාරය විසින් දරණ බව දන්වා ඇත. ඉන්පසු 2019. 04. 10 දින සංස්ථාව වෙත මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ අමප /19/0871/115/018 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහජන බැංකුවේ ණය මුදල පියවීමට මහා භාන්ඩාගාරය සංස්ථාවට අවුරුදු 05 අය වැය වෙන් කිරීම යටතේ මුදල් ලබා දෙන බවත්, එම මුදල ප්‍රාග්ධනිත කරන ලෙසත් සඳහන් කර ඇත.

එම තීරණයට අනුව 2018 දී ආනයන ව්‍යාපෘති අලාභය මහ භාණ්ඩාගාරය වෙත චිතැන් නොකර සංස්ථාවේ ලාභයෙන් ගැළපීමට සිදු විය. මෙම අලාභය සංස්ථාවේ සිදු වූ අකර්මණ්‍යතාවය හෝ කළමණාකරන දුර්වලතා මත සිදු වූ දෙයක් නොව රජයේ අවශ්‍යතාවය අනුව කටයුතු කිරීමට සිදු වීම නිසා මහා භාණ්ඩාගාරය විසින් භාර ගැනීමට එකඟ වී තිබූ අලාභය සංස්ථාව වෙත නැවතත් චිතැන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ උපදෙස් දී තිබීම නිසා සිදු වූ අලාභයකි

3.2. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

එකඟ වේ. 2022 වසරේ සිට නියමිත දිනට මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

3.3 ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම.

2018 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව 2019 මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

මෙයට - විශ්වාසී වූ,

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ,

වෙනුර ගුණවර්ධන
සභාපති